
සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2025

# 71 - සිංහල

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන / සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

## 71 - සිංහල I

## ලකුණු බෙදී යාම

## I පත්‍රය

මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය :-** මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් (07) සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 යි (4 x 4 = 16)
  (මේ කොටස් පහෙන් හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)
- (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 යි (3 x 4 = 12)
  (i, ii, iii, iv, v, vi, vii මේ කොටස්වලින් අවස්ථා සම්බන්ධ හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)
- (එ) රසාස්වාදය - ලකුණු 12 යි.

**ලකුණු 40 යි.**

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරෙන් හතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි. (4 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි.)

| | | |
|---|---|---|
| පළමු ප්‍රශ්නය | 16 + 12 + 12 | = 40 |
| 02 - 08 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න 04 ක් සඳහා | 15 x 4 | = 60 |
| | | 100 |



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 71 - සිංහල I කොටස

**1.** පහත දක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) ගල් පාවුලට ගිය කලට 'සොඳුර, මෙතැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙනයන්ට බැරි ය. බොහෝදෙනා ගෙනගිය කල කසළත් කෙරෙති. නවතාලියත් නොහැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන්ට පුදන්ට ගෙනයන දෙය බැවින් පිදේනිය තොපි ම අල්වාගනුව'යි කිවුය. උයිත් එලෙස ම කළහ. සොරාත් උන් කැඳවාගෙන සොරුන් හෙළන ගල උඩට නැංගේය. ඒ ගලටත් එක් දසාවෙකින් මිනිස්සු නැගෙති. එක් දසාවක් ප්‍රපාත ව තිබෙන හෙයින් ගල්මුදුනෙහි සිටලා එතැනින් සොරුන් හෙළති. ඌ කඩ කඩ ව තීම නෙති. එහෙයින් ඒ ගලට සොරපවුව යයි කියති. සිටුදුවණියෝ ද ගල මුදුනේ සිට 'බිලියම් කරන්නැ'යි කිවුය. ඒ බැණ නොනැගෙත්තේය. 'බැණ නොනැගෙත්තේ හැයි දැ'යි විචාළ හෙයින් 'මට බිලියමින් කම් නැත. බිලියම් පිට ලාලා තොප මෙතැනට ගෙනෙන පිණිස ය'යි කීය. 'ගෙනායේ හැයි දැ'යි විචාළ කල්හි, 'තොප මරාපියා ආභරණ හැරගෙන පලායන්ට ය'යි කීය. ඌ තුමූ බා ගොසින් 'ස්වාමීනි, මාත් ආභරණත් මුඹ සන්තක වුව මරන්නේ හැයි ද? ආභරණත් හැරගතමැනව. මා අතිනුත් මෙහෙ හැරගතමැනවැ'යි කිවුය. ඒ කෙසේ කීවත් නොගිවිස ම මරන්ට ම තත්පර ව ගත. 'හැඟිවනු මැනව. මා මියයාමෙන් ප්‍රයෝජන නැත. ආභරණ හැරගෙන මාගෙනුත් **මිඩිකම්** හැරගතමැනවැ'යි කිවුය.

(i) මෙහි සඳහන් ස්ත්‍රිය, තමා නොමැරීමට හේතු සේ ඉදිරිපත් කළ කරුණු මොනවා ද?
(ii) දෙවියන්ට පූජා කිරීමට ගෙන යන දෙය හඳුන්වා ඇත්තේ කවර නමකින් ද?
(iii) "ඒ කෙසේ කීවත් නොගිවිස ම මරන්ට ම තත්පර ව ගත" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'මිඩිකම්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) තමාත්, ආභරණත් ඔහු සතු නිසා ආභරණත් ගෙන තමන්ගෙනුත් මෙහෙකාරකම්/ සේවාකම් ලබා ගත හැකි වීම
(ii) පිදේනිය
(iii) ඔහු/සොරා, කෙසේ පැවසුව ද නො පිළිගෙන/ ගිවිස නො ගෙන/ එකඟ නො වී මරණයට පත් කිරීමට ම උත්සාහ ගත්තේ ය. / ඇලී සිටියේ ය./ යොමු ව සිටියේ ය.
(iv) මෙහෙකාරකම්/දාසකම්/වහල්කම්

*(ලකුණු 1 x 4 = ලකුණු 04 යි)*

(ආ) එවේලෙහි රජකුමරුවන් **යත්යත්** උපාලි ආභරණ පොදිය අතින් අල්වාගෙන බලබලා සිට අනගි වූ සම්පතෙහි ඉතා හය ඇතිව ශාක්‍යයෝ නම් ඉතා ගුණ නපුරුහ. මේ සම්පත් හැරගෙන රාජ්‍යයට ගොස් මා මෙපවත් කී කල "සම්පත්තිලෝභයෙන් රජදරුවන් උගන්වාගෙන යවාපූයේ මේ කපුවා"යි මට කිපී මරා දමාපූ නම් නපුර; සම්පත් තබා දිවි ගලවා ගතොතින් යෙහෙක; මේ මට සැපතෙක් නොවෙයි, විපතට කාරණය; මෙවැනි රජුන් සැපත් හැර මහණ වන කල මා වැනියන්ට සැපතින් කම් නැත. මම ද ඔවුන් හා සමග ගොස් මහණ වෙම්'යි සිතා ආභරණ පොදියපිටින් ගසෙක එල්වා "පළමුව දුටු කෙනකුන් තෙලෙ හැරගන්නේය"යි අත් ගසා රජදරුවන් ගිය පදසලකුණෙන් දිව ගොස් රජකුමරුවන් හඹා ගියහ. එකල "අවුනැ"යි රජකුමරුවන් විචාළ කල තමන් ආ පවත් කියා "මම ද මහණ වෙම්"යි කීහ. රජකුමරුවෝ "තොප ආ සේ ම යෙහෙක වරෝය"යි කියා උනුදු කැඳවාගෙන ගොස් එකලට බුදුන් මල්ලරජුන්ගේ අනුපිය නම් නියම්ගම අනුපිය නම් වෙනෙහි වසන තෙනට ගොසින් බුදුන් දැක වැඳ එකත්පස්ව උන්හ. එකල ස්වාමිදරුවෝ ඔවුන් ආ කාරණා විචාරා මහණ වන්නට ආ බව අසා අවසර දුන්සේක.

(i) මේ ඡේදයට අනුව "මම ද මහණ වෙම්" යනුවෙන් ප්‍රකාශ කළ තැනැත්තා කවරෙක් ද?
(ii) ආභරණ පොදිය නිසා ජීවිත තර්ජනයක් එල්ල විය හැක්කේ කවුරුන්ගෙන් ද?
(iii) "රජදරුවන් ගිය පදසලකුණෙන් දිව ගොස් රජකුමරුවන් හඹා ගියහ." මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'යත්යත්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) උපාලි කපුවා/ උපාලි කරණවැමියා/ උපාලි නැමති කෙස් රැවුළු කපන්නා/දැළි රැවුළු කපන්නා
(ii) ශාක්‍යයන්ගෙන්/ රජකුමරුවරුන්ගේ ඥාතීන්ගෙන්
(iii) රාජ කුමාරවරුන් ගමන් කළ පා සටහනින්/ පාද ලාංඡනයෙන්/ අඩි සලකුණෙන් දිව ගොස් රාජ කුමාරවරුන් පසුපස ලුහු බැන්දේ ය.
(iv) යද්දී /යමින් සිටිය දී

*(ලකුණු 1 x 4 = ලකුණු 04 යි)*

(ඉ) කින්නරාඞ්ගනා ද ඔහු දැක "මේ සොරහු විසින් වූ සැවිය, මාගේ ස්වාමි පුරුෂයාණන් විදිනා ලද්දේය"යි භය සෝක දෙකින් වෙවුලමින් දිව ගොස් පර්වත මුදුනට නැගී රජහට **අවත්ට** පටන් ගත්හ. ඒ කෙසේ ද? යත්, "යම් රජෙක් මාගේ කැමති සමණන් කියිලි මැද විද පී ද ඒ තෙම විත් කා ගර වේගයෙන් තැති ගත්තේ විසංඥ ව බිම වැද හොත්තේය. අනේ මා දිව ගෙන ගොස් පර්වත මුදුනෙක ලා මේ සා දුඃඛයක් උපදවන ලද පාපිෂ්ට වූ තා වැනි ද්‍රෝහී මාගේ ස්වාමි පුත්‍රයාණන් මා උදෙසා මැරී නම් මාගේ ස්වාමි පුත්‍රයාට පැමිණි මරණ දුක්ඛය තට ද වේව යි මට පැමිණියා වූ මේ ශෝකය තාගේ අඹුදරුවන්ට ද වේව යි, තව ද දුෂ්ට වූ මහ රජ තාගේ ප්‍රජාපතී තොම තා ද තමන් දරුවන් ද නො දැක නිරා වදීව"යි යනාදීන් ඇවිලි අව අවා අඬන්ට පටන් ගත්හ. රජ්ජුරුවෝ ද මෙසේ හඬන්තිය, අස්වසන්නා වූ මහ බෝසත්හු විත් කා අඬන වේලෙහි මා නම කියා හැඬූ හෙයින් නම දැන ද "ගින්නේර මල් බඳු ඇස් ඇති මනා වූ භාවභාව ලීලා විලාස ඇති චන්ද්‍රිකාව තෝ සෝක නො කරව. ඉදින් තෝ කැමති වී නම් මට බිරින්ද කොට සොළොස් දහසක් පුරාඞ්ගනාවන් මධ්‍යයෙහි රජකුලයෙහි ප්‍රසිද්ධව"යි කී හ. එපවත් අසා චන්ද්‍රිකා තොම "අවලක්ෂණ, තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමණා මැරී ද? ඔහු කෙරේ ස්නේහයෙන් අඬා මියන පමණක් මුත් තොපට පාදපරිචාරිකා වීමෙක් ඒකාන්තයෙන් නොවෙයි," තද කොට කිව.

(i) රජුගේ ප්‍රකාශනයට චන්ද්‍රිකා ලබා දුන් අවසාන නිගමනය කුමක් ද?
(ii) රජතුමා කිඳුරියගේ නම 'චන්ද්‍රිකා' බව දැන ගත්තේ කෙසේ ද?
(iii) "මේ සා දුඃඛයක් උපදවන ලද පාපිෂ්ට වූ තා වැනි ද්‍රෝහී" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**අවත්ට**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) ඔහු කෙරේ ආදරයෙන්/ ප්‍රේමයෙන්/ හඬා මැරෙනවා හැර ඒකාන්තයෙන් ම නුඹට භාර්යා නො වෙමි.
(ii) ඊතල/ හීතල/ සර/ ශර පහර වැදී සිටින අවස්ථාවේ මහා බෝධිසත්ත්වයන් තම බිරිඳගේ නම කියමින් හැඬූ නිසා
(iii) මේ තරම් දුකක් ඇති කරවන ලද පව්කාර බවින් යුතු/ වඩාත් පාපී වූ/ අතිශයින් පාපී වූ/නුඹ වැනි විරුද්ධ/ සතුරු/ එදිරිවාදී
(iv) ශාප කරන්නට

(ලකුණු 1 x 4 = ලකුණු 04 යි)

(ඊ) මෙසේ වෙළෙඳ භාර්‍යාවන් කී නොයෙක් කාරණ කටයුතු සියල්ල ම මෙහෙවරට ආ කෙලී ගොසින් අමාත්‍යයාට කිව. නැවතත් ඒ මෝහයෙන් මුළා වූ අඥාන අමාත්‍යයා තමා ස්වභාවයෙන් ම මුළා හෙයින් පළමු තුන්වාරයට වඩා පඬුරු දී කෙල්ල නික්මවිය. වෙළෙඳාණන්ගේ භාර්‍යාවෝ සතරවන වාරයේ පඬුරු ඇරගෙන ගිය එම කෙල්ල දැක "මේ ලජ්ජා නැති මිනිසෙකැ දැන් මා ඔහු තද කොට කියා වැළකුව මැනවැ"යි සිතා කියන්නාහු "එම්බා, තොපගේ අමාත්‍යයාණෝ මිරිඟුදිය ගෙනවුත් කළ සැළ ආදියෙහි පුරා තබාගෙන ඉදින් ප්‍රයෝජන විඳිත් නමුත් ඒකාන්තයෙන් ම උන් හා මා හා සමාගමයෙක් නොවන්නේය. ඉදින් ශරත්කාලයෙහි වලාකඩක් ගෙන වැටියක් කොට අඹරාගෙන **වණ්ණු තෙලයෙන්** තෙමා තමාගේ ගෙය පහන් දල්වා ආලෝක පතුරුවාගෙන ඉන්නේ වී නුමුත් උන් හා සමඟ මාගේ සමාගමයෙක් නොවෙයි. තව ද නුග දිඹුල් ඇසතු ආදි වනස්පති වෘක්ෂයෝ පුෂ්පදාමයෙන් විභූෂිත ව මාගේ ගෙට තුමූ ම එන්නාහු වී නමුත් එබඳු අපූර්වයක් පැමිණි දවසෙකත් උන් හා මා හා සමාගමයෙක් නොවෙයි.

(i) වෙළෙඳ භාර්යාව සතර වන වරටත් තමා වෙත පඬුරු එවූ පුද්ගලයා හඳුන්වා ඇත්තේ කවර ප්‍රකාශනයකින් ද?
(ii) වෙළෙඳ භාර්යාව සහ අමාත්‍යයා අතර සමාගමයක් නොවන බව තහවුරු කිරීමට මෙහි විශේෂ ප්‍රකාශ කීයක් දක්වා තිබේ ද?
(iii) "නුග දිඹුල් ඇසතු ආදි වනස්පති වෘක්ෂයෝ පුෂ්පදාමයෙන් විභූෂිත ව" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**වණ්ණු තෙලයෙන්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) ලැජ්ජා නැති මිනිසකු ලෙස
(ii) තුනයි (03)
(iii) නුග, දිඹුල් ඇසතු (බෝ) වැනි විශාල ලෙස වැඩෙන ගස් මල් දමින් බැබළී/ මල්වැල්වලින් බැබළී/අලංකාර ව
(iv) වැලි තෙලෙන්/වැලි මිරිකා ගත් තෙලින්

(ලකුණු 1 x 4 = ලකුණු 04 යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ඞ) ය ට සි න් ලත බැල්මෙන් සුර විල සී
වෙසෙසින් දනමන මත්කර එක සී
අ හ සි න් බැස රඟ ගත් රඟ කෙලෙ සී
දි සි මෙ න් විය විදුලිය සියදහ සී

දි මු තු යසස් වන් කුසුම සරා ගේ
නු මු තු සුවඳ මල් පැලඳ සරා ගේ
ද කි තු රඟන සුරඟන රඟ ලා ගේ
උ ම තු නොවෙද කෙලෙසක සිත කා ගේ

(i) කවුරුන්ගේ වුවත් සිත් උමතු කරවීමට හේතු වූ කාරණය කුමක් ද?
(ii) පළමු වන පද්‍යයේ දැක්වෙන උපමාව කුමක් ද?
(iii) "දිමුතු යසස් වන් කුසුම සරා ගේ" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**සුර විලසී**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) සුරඟනන්ගේ රැඟුම/ දෙවඟන රැඟුම
(ii) දිසි මෙන් විය විදුලිය සිය දහසී (විදුලිය සිය දහසක් පෙනුණාක් මෙන් විය.)
(iii) අනංගයාගේ දීප්තිමත් කීර්තිය වැනි
(iv) දිව්‍ය විලාසිනීන්/ දෙවඟනන්/ සුරඟනන්/ දිව්‍යාංගනාවන්

*(ලකුණු 1 x 4 = ලකුණු 04 යි)*

● (ඉ) සහ (ඊ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඉ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "එසේ වී නම් පින්වත්නි, තොප ඇම අප්‍රමාද ව මෛත්‍රීභාවනාව කරව"
(ii) "ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී තියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන් ද?"
(iii) "බත් උපදිනේ බඩසලිනැ"
(iv) "අපට අනික් කවුරුනුත් නොකැමැත්තේ මුන් නොලදොත් මියමී"
(v) "සිරී, හොඳ සෝන්ග් එකක් ඇහෙනවා"
(vi) "මං ආපහු ගෙදර එන්ඩ ඕනෑ අප්පොච්චී. මට බෑ මේ ගෙදර ඉන්ඩ."
(vii) සරණ වූ නිමිත්තෙන ගුරුතුමා
මංගල විලාසයෙන්
කෙළිත්වා සිසුහු සැම,
අලස සුව විඳිත්වා ..."

(ලකුණු 03 × 4 = 12 යි.)

(i) ගම්පොළ අවධියේ විසූ ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ නන්දි වාණිජ වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. ශිව ඇමතියා විසින් නන්දිය වෙළෙන්දා මරා දැමීමට මළ මිනියක් ජප කොට නැවට එවූ අවස්ථාවේ නැවේ සිටි මිනිසුන් බියට පත් වූ විට නන්දිය වෙළෙන්දා විසින් පිරිසට කියන ලද්දකි.
(ii) පන්සිය පනස් ජාතක පොතේ චන්දකින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. බරණැස් රජුගේ ඊතල පහර කෑ බෝධිසත්වයන් සිහිසුන් ව සිටිනු දැක ඊතල පහර කෑ බව නොදත් චන්ද්‍රිකාව විසින් තමාට ම පවසන ලද්දකි.
(iii) දඹදෙණි අවධියේ විසූ බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ අනුරුද්ධ කුමාර කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. එම කථා වස්තුවේ කුමාරවරුන් තිදෙනා ක්‍රීඩා කරන විට බත් උපදින්නේ කෙසේ ද? යන ප්‍රශ්නයට පිළිතුර ලෙස කිම්බිල කුමාරයා විසින් අනෙක් කුමාරවරුන්ට කරන ලද ප්‍රකාශයකි.

(iv) දඹදෙණි අවධියේ විසූ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේශී කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. මරන්නට ගෙන යන සොරකු දැක ඔහු පිළිබඳ සිත් ඇති ව ඇඳට වැද සිටින සිටු දියණියන්ට මව විසින් කරුණු පැහැදිලි කරන අවස්ථාවේ සිටු දියණියන් විසින් තම මවට කරන ලද ප්‍රකාශයකි.

(v) කෙටිකතා සංග්‍රහයේ ඒ. වී සුරවීර විසින් රචිත අකුරට යන වෙලාවේ කෙටිකතාවෙන් උපුටා ගන්නා ලද්දකි. මැණිකා ට්වින්කල් ට්වින්කල් ගීතය කවියක් ලෙස ගායනා කරන විට සිරි කාමරයේ සිට සාලයට පැමිණේ. එවිට මිස්ට කරුණාපාල විසින් සිරි අමතා කරන ලද ප්‍රකාශයකි.

(vi) ඒ. පී. ගුණරත්න විසින් අනුවර්තනය කරන ලද බැද්දේගම කෘතියෙන් උපුටා ගන්නා ලද්දකි. පුංචිරාළ සමග විවාහ වී සිටින හින්නිහාමි බැලීමට, පුංචිරාළගේ ගෙදර කඩුල්ල ළඟ සියඹලා ගස යටට සිලිඳු ගිය අවස්ථාවේ හින්නිහාමි විසින් සිලිඳුට කරන ලද ප්‍රකාශයකි.

(vii) එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත පෙමතො ජායතී සොකො නාට්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි. විවාහයෙන් පසු (ගෘහ වාසය ඇරඹීමෙන් පසු ව) සිප්හලට නොගිය උද්දාල බමුණාට එහි යන ලෙස ස්වර්ණතිලකා පැවසූ අවස්ථාවේ උද්දාල බමුණා විසින් ස්වර්ණතිලකාට කරන ලද ප්‍රකාශයකි.

*ලකුණු දීමේ නිර්ණායක*
*කතුවරයා, කෘතිය, කතා වස්තුව/ කතාව සඳහා ලකුණු 01යි*
*කා විසින් කාට කියන ලද ද ලකුණු 01 යි*
*අවස්ථාවට ලකුණු 01 යි*


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(එ) වස්තු විෂය හා භාෂා භාවිතය කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**දුරු රට ගිය පුතු**

හිරු එළිය ගලා එයි කුටියට
කවුළු පියන් පත් අතරින්
සුපුරුදු විලසින් ම
එහෙත් කිම
ඒ හිරු එළිය අද දින
මලානික වී
අවදි නොකරන්නේ මසිත

ඇසෙන නෙක විහඟ ගී නද
අලුයමින් පෙරදා ලෙස
රිදුම් දෙනු විනා මා සිත
නොගෙනෙන්නේ කිම ද කිසි මිහිරක්

පිපී අතු අග නෙක මල්
සැලෙනා නමුදු මඳ පවනේ
හද සැනසූ සුවඳ පෙර දින
නොදැනෙන්නේ කිම ද අද දින

වෙළා ගෙන මා ගත සිත
පාළුව ගලා වික් මා වට කොට
අත්මිදෙනු කෙලෙස ද
මේ රුදු පාළු හැඟුමින්

දුරු රටක ගිය මා පුතු
එන තුරු බලා හිඳිනට
හුරු කොට ගත යුතු නොවෙ ද
මා නෙතු
සඟවා වුව ද කඳුළැලි
දුරු රටක ගිය ඔහු
මා පුතු ද
මා හිත මිතුරු ද බැවින (ලකුණු 12 යි.)

දුරු රට ගිය පුතු

➢ <u>කවියා හා වස්තු විෂය</u>

නිදහස් කවියේ ද්විතීය තරංගයට/ දෙවන පරපුරට අයත් බුද්ධදාස ගලප්පත්ති තත්කාලීන සමාජ සංස්ථාව තුළ නිර්මාණය වූ සමාජමය ගැටලු පදනම් කර ගනිමින් පෙරළිකාර විරෝධාකල්ප සමාජගත කළ පද්‍ය රචකයෙකි. කාව්‍ය ආකෘතිය, වස්තු විෂය හා කාව්‍ය භාෂාව යන අංශයන්ගේ නවතාවෙන් පූර්ණ කාව්‍යෝක්ති, උපයෝගී කර ගනිමින් නිර්මාණය කරන ලද පද්‍ය පන්තියක් වශයෙන් 'දුරු රට ගිය පුතු' හැඳින්විය හැකි ය.

- පෞද්ගලික අද්දැකීමක් කවියා පොදු අද්දැකීමක් බවට පත් කොට තම පුතුගේ දුරස්ව යාම නිරූපණය කොට ඇත.
- පාළුව, තනිකම, සාංකාව මග හරවා ගැනීමට නොහැකි වීම නිසා සොබා දහමේ සිදු වන සංසිද්ධීන් පවා මිහිරි ලෙස ග්‍රහණය කර ගැනීමට කවියාට නොහැකි වී ඇත.

හිරු එළිය
විහඟ ගී
පිපෙන මල්

- කම්පාවට පත් ව ඇති පියකුගේ මානසික ආතතිය මෙම පද්‍ය පන්තියේ මනා ව නිරූපණය කොට ඇත.

  වෙළා ගෙන මා ගත සිත
  පාළුව ගලා විත් මා වට කොට

- තමාගේ පුතා මෙන් ම තමාගේ හිත මිතුරා වන්නේ ද පුතා ම බව පවසයි.

  සඟවා වුව ද කඳුළැලි
  දුරු රටක ගිය ඔහු
  මා පුතු ද
  මා හිත මිතුරු ද බැවින

➢ භාෂා භාවිතය

- නවමු කාව්‍ය සංකල්ප

  පිපී අතු අග නෙක මල්
  සැලෙනා නමුදු මද පවනේ
  හද සැනසූ සුවඳ පෙර දින
  නොදැනෙන්නේ කිම ද අද දින

- සරල භාෂා භාවිතය

  හිරු එළිය ගලා එයි කුටියට
  කවුළු පියන් පත් අතරින්

- සරල භාෂාව කාව්‍යානුභූතිය සමග මනාව ගැළපීමෙන් භාවමය හැඟීම් උද්දීපනය කිරීමට කවියා සමත් ව ඇත.

  රිදුම් දෙනු විනා මා සිත
  නොගෙනෙන්නේ කිම ද කිසි මිහිරක්

- මනා වූ විචිත්‍ර ගෙත්තමක් සේ සියලු පදවැල් අනුභූතිය හා සංයෝග වී පැවතීම මෙම පද්‍ය පන්තියේ විශේෂ ගුණාංගයකි.

- ආත්ම භාෂණය

  වෙළා ගෙන මා ගත සිත

- සංකල්ප රූප දැනවීම

  එහෙත් කිම
  ඒ හිරු එළිය අද දින
  මලානික වී

- අවස්ථාවට උචිත කාව්‍යෝක්ති භාවිතය

  වෙළා ගෙන මා ගත සිත
  පාළුව ගලා විත් මා වට කොට

- අවස්ථාවට උචිත යෙදුම් භාවිතය

  හුරු කොට ගත යුතු නො වෙද
  මා නෙතු
  සඟවා වුව ද කඳුළැලි

*(ලකුණු 12 යි)*



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**2.** **පුද්ගල චිත්තාභ්‍යන්තරයේ පවත්නා පොදු දුර්වලතා නිසා ඇති වන ව්‍යසන රසවත් ව ඉදිරිපත් කිරීමට සද්ධර්මරත්නාවලි කතුවරයා දැක්වූ දක්ෂතාව නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.**

**නැත හොත්**

**"ඇතැම් විට ජාතක කථාවක දක්නට ලැබෙන්නේ සුළු පුවතක් වුවත් එහි කථා රසය පමණක් නො ව කිසියම් සාරධර්මයක් ද ගැබ් ව තිබේ." නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.**

**(ලකුණු 15 යි.)**

**සද්ධර්මරත්නාවලිය**

සද්ධර්මරත්නාවලිය රචනා වන්නේ දඹදෙණි අවධියේ දී ය. ඊට මූලාශ්‍රය වී ඇත්තේ පාලි ධම්මපදට්ඨ කථාව යි. මේ කෘතියේ කර්තෘවර ධර්මසේන හිමියන්ගේ මුඛ්‍ය අධ්‍යාසය වී ඇත්තේ පුද්ගල චිත්තාභ්‍යන්තරයේ පවත්නා පොදු දුර්වලතා හේතුවෙන් හට ගැනෙන ව්‍යසන රසෝද්දීපනය වන ආකාරයෙන් සරල ව ඉදිරිපත් කිරීම ය. නිර්දිෂ්ට කතා ආශ්‍රයෙන් විමර්ශනය කර බැලීමේ දී බොහෝ පිරිසකට පොදු මානව දුර්වලතාවයක් වශයෙන් හඳුනාගත හැකි වන්නේ මසුරුකම යි. මට්ටකුණ්ඩලී කථා වස්තුවෙන් පිළිබිඹු වන්නේ එම මසුරුකම ය.

- මණ්ඩලකුණ්ඩලී වස්තුවෙහි මසුරුකම නිරූපණය කිරීමේ දී කතු හිමියන් විවිධ අවස්ථා, සිද්ධි හා ක්‍රියාකාරකම් යෝග්‍ය ආකාරයෙන් යොදා ගෙන තිබේ.
  - කුණ්ඩලාභරණය සෑදීමේ අවස්ථාව
  - රෝගී වූ දරුවාට ප්‍රතිකාර කිරීමට මැළිවීම
    "උදාඃ පින්වත් බැමිණි ය කුමක් කියයි ද,
    ඒ ඒ විෂයට ප්‍රතිනියත මන්ත්‍රාදිය තිබියදී අනික්
    මන්ත්‍රාදියකින් විෂ බාමින් සිටිය දී...,"
- මට්ටකුණ්ඩලී මිය යාමෙන් අනතුරු ව සොහොනේ හඬා වැලපීම
- දරුවා මිය යාමෙන් පසු අදින්නපුබ්බකගේ සිතුවිලි වෙනස් වීම
  "ළදරුවාණෙනි, තොපි ඉල්වන සක්සඟල මාගේ සම්පත් බොහෝ ව ඇති බැවින් රත්තරනින් වුවත්, රිදියෙන් වුවත් මුතු මැණික් ආදියෙන් වුවත් තොප කියා ලූ තරමෙක කරවා දෙමි.
- මුරණ්ඩු බව - මසුරුකම මෙන් ම මුරණ්ඩුකම ද පොදු මානව දුර්වලතාවක් වශයෙන් කතු හිමියෝ ඉස්මතු කළහ.
  තම සිතැඟිවලට අවනත වීම නිසා ඇති වන ව්‍යසන කුණ්ඩලකේශිගේ වස්තුවෙන් නිරූපණය වේ.
- සොරාගේ සිත් ඇඳ බැඳ තබා ගැනීමට ගන්නා කුමරිය ගන්නා උත්සාහය
  " ඔහු සිත් ගන්ට සව්භරණ ලා සැරහී ගෙන තුමූ ම ඕ හට බත් මාළු පිසති, කවති, පොවති, ඉස සෝධවති, නාවති... "
- සොරාගේ චිත්ත ස්වභාවය
  "මෑ මරා පියා මැගේ ආභරණ හැරගෙන රා බී ඇවිදිනවුන්ට විකුටපියා අභිප්‍රාය දෙයක් හැරගෙන කාපියන්නේ කවර දවසෙක දෝ හෝ..."
- සිටු දියණිය සොරා මැරීමට උපක්‍රම යෙදීම
  "ස්වාමිනී, මේ කෙළවර දැක්ම ය. මෙවක් පටන් මුඹවහන්සේ මා දැක්මකුත් මාගේ මුඹවහන්සේ දැක්මකුත් නැතැ..."

ජාතක කතා

පාලි ජාතකට්ඨ කථාව මූලාශ්‍රය කරගනිමින් කුරුණෑගල අවධියේ ලියන ලද පන්සිය පනස් ජාතක පොතේ චුල්ලධනුද්ධර ජාතක කථාව හා චන්දකින්නර ජාතක කථාවේ සුළු පුවතක් විස්තර වී තිබුණ ද එයින් සමාජය වෙත පිරිනමන කතා රසය මෙන් ම පතිව්‍රතා ධර්මය පිළිබඳ ව දෙනු ලබන පණිවිඩය ඉතා ඉහළ ය. ඒ අනුව කතා රසය ගත් කල්හි චුල්ලධනුද්ධර ජාතක කථාවේත් චන්දකින්නර ජාතක කථාවේත් ඒ බැව් මැනවින් පිළිබිඹු වේ.

➤ කතා රසය

- සංවාදාත්මක භාෂා භාවිතය

  " ඇයි ස්වාමි පුත්‍රයාණෙනි, මා ඇර පියා නික්මුණු තියා දැ" යි

  " ස්වාමිනී, මෙසේ වූ උපද්‍රව ඇති තෙනින් අපට ප්‍රයෝජන කිම් ද? "

- උපමා භාවිතය

  " බුදු රජහු සාගර ජලයෙන් සැඟවී තුබූ මෙර පත්ලෙහි සත්රුවන් වැල්ල තෙල වේ දැ යි ගෙන හැර පානා කලක් පරිද්දෙන් "

- හේතු ඵල සම්බන්ධය

  " පිළිස්සූ මාංශ නොදී අමු මාංශ දුන්නේ අප කෙරේ කනස්සලුවෙන්දැ" යි

  " මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමග වාසය කෙළෙම් නම් යහපතැ" යි

  මනා චරිත නිරූපණය

  " මැගෙන් මට ප්‍රයෝජන නැතැ යි "මැ මෙතන ම ඇර පියා යෙමි " යි

  " අවලක්ෂණය, තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමණා මැරී ද?"

- චිත්තරූප මැවෙන අවස්ථා

  "සොඳුර කඩුව දී ලව"යි අත දික් කොට ලන්නා "

- කෙටි වැකි හා දිගු වැකි භාවිතය

  "ඒ හස්තියා ධනුද්ධරයන් දැක දිව ගෙන ආ ය."

  "ශක්‍රයෝ මෙපවත් දැන පංචසිඛයා..."

  "ඒ කිඳුරංගනා තොම රජහු නිරපේක්ෂ ව පලා ගියදු..."

මෙබඳු උදාහරණ තුනක් වත් ගෙන කතා රසය මතු කරන ආකාරය පැහැදිලි කර තිබීම සෑහේ.

➤ සාරධර්ම

- පතිව්‍රතා ධර්මයෙහි අගය සමාජ ගත කිරීම

  " පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ නොකටයුත්තක් නො කරව..."

  " තොප මට සිනාසෙන්නට කාරණා කිම් ද?..."

  " එකල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ ශෝකාග්නි වේගය..."

  " අඬා මියන පමණක් මුත් තොපට පාදපරිචාරිකා වීමෙක් ඒකාන්තයෙන් නොවෙ යි "

- මිනිස් සිත ක්‍රියා කරන ආකාරය

  " බාල කල පටන් පරණ පුරුදු පුරුෂයා මරවා මා කෙරේ ලෝභ කළා ය. ඉදිරියේ අනිත් පුරුෂයෙකු දුටත් මටත් මේ කරන මානය..."

  " දඩ මස් පුළුස්සා කන මිනිසුන් උන් තෙනට ගොස් දඩමස් ඉල්ව ගෙන එව..."

- තමන කළ කී දේ අනුව ප්‍රතිඵල විඳීමට සිදු වන බව

  " පළමු පිසවා කෑ සමුණනුත් නැති ව, අලුත් සමුණනුත් නැති ව උභයභ්‍රෂ්ට ව ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නේ ය..."

  " ස්වාමිනි, යම් බඳු තුඹ වහන්සේ මාගේ ප්‍රිය කල් වූ ඇඟ අමා ඉස නිදුක් කොට මාගේ එකලාකම් දුරු කොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක් ද?..."


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- 
- අනියම් සබඳතා සඳහා මිනිස් සිත්වල ඇති නැඹුරු වීම
  " සොඳුර කඩුව දී ලව යි අත දික් කොට ලන්නා සොරාට කඩු මිට දී වුල්ලධනුද්ධරයන්ට කොපුව දී ලූහ."
  " මම තී පාදපරිචාරිකා කොට සොළොස් දහසක් පුරඟනාවන්ට අග මෙහෙසුන් කෙරෙමි "
- සෑම යහපත් හෝ අයහපත් ක්‍රියාවකටම ඒ සමාන ප්‍රතිඵල විඳීමට සිදුවන බව
  " පළමු මෙසේ වූ නොකොටයුත්ත කොට මෙසේ වූ දුක පැමිණියෙමි "
  " එකෙණෙහිම විෂ නැසී වණය සුව ව කොතන විදි බවත් නොදත හැකි විය "

මේ ආකාරයට උදාහරණ තුනක් වත් ගෙන ජාතක කථා දෙකෙන් ම යම් කිසි සාරධර්මයක් සමාජගත කිරීමට කතුවරයා උත්සාහ දරා ඇති ආකාරය පැහැදිලි කර තිබිය යුතුයි.

*(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න)*

*(ලකුණු 15 යි)*

3. තම ශ්‍රාවකයා බුද්ධාලම්බන ප්‍රීතියෙන් උද්දාමයට පත් කරවමින් වෘත්තාන්ත රචනයෙහි ලා පූජාවලී කතුවරයාගේ නිර්මාණ කෞශල්‍යය නියමිත කථා වස්තු ආශ්‍රයෙන් පහදන්න.

**නැත හොත්**

"සිත් ඇදගන්නා වෘත්තාන්ත මාර්ගයෙන් සත්පුරුෂ ජනයා ධර්ම මාර්ගයට යොමු කිරීම සද්ධර්මාලංකාර කතුවරයාගේ පරමාර්ථය විය." නියමිත කථා වස්තු ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

**පූජාවලිය**

දඹදෙණි සාහිත්‍ය අවධියේ මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් පූජාර්ථයෙන් ලියවුණු කෘතිය පූජාවලියයි. ශ්‍රාවකයා තුළ බුද්ධාලම්භන ප්‍රීතිය ඇති කරවමින් වෘතාන්ත රචනයෙහි ලා දැක්වූ කුසලතාව ජීවක වෛද්‍යවරයාගේ කථාව හා අනුරුද්ධ කුමාර කථාව ඇසුරින් උදාහරණ දක්වමින් පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.

බුදුරජාණන් වහන්සේගේ ගුණ කියැවෙන අවස්ථා පිළිතුර සඳහා අන්තර්ගත විය යුතුයි.

- ශක්‍ර දෙවියන් දිසාපාමොක් ආචාර්යවරයාගේ මුඛයට ආරූඪ වී ජීවක ආශ්චර්යමත් වෛද්‍යාචාර්යවරයෙකු බවට පත් කිරීම
  " මාගේ බුදුන්ට මතු පිළියම් කරන වෙදහුට මම ආචාරිය වෙමි..."
- ජීවක වෛද්‍යවරයෙකු බවට පත් වූයේ බුදුන්ට පිළියම් කිරීමට පහළ වූ කෘත්‍යාධිකාර පුණ්‍යවන්තයා නිසා ම ය.
  " බුදුන්ට පිළියම් කෙරෙමි යි කප්ලක්ෂයක් පෙරුම් පුරා ආ කෘතාධිකාර පුණ්‍යවන්තයා හෙයිනුත් "
- චණ්ඩප්‍රද්‍යෝත රජතුමාගේ පෙර ආත්මයේ දී අනුන් විසින් දෙන බත්පත වේලාව නොවරදවා පසේ බුදුන් කෙනෙකුන්ට පිළිගන්වා කරන ලද ප්‍රාර්ථනාව ආශ්චර්යමත් ලෙස ඉටු වීම
  " මතු මෙසේ වූ දුක්ඛිත කාලයක නුපදිම්වයි, රජකුලෙහි උපදිම්වයි. මේ බත්පාත්‍රය ඉස ගූ පිනින් මතු මා උසුලන ශීඝ්‍ර වාහන ලබම්ව යි..."
- අනුරුද්ධ කුමාරයා නැතැයි යන බසක් හඳුනා නොගත්තේ පෙර අත්භවෙක දැහැමෙන් සෙමෙන් උපයා ගත් බත් පතක් පසේ බුදුවරයෙකුට පූජා කොට කළ ප්‍රාර්ථනාවේ අනුහසිනි.
  තමන් බැලමෙහෙ කොට ලත් බත් කොට්ඨාසය උන්වහන්සේගේ පාත්‍රයට පිළිගන්වාලා මේ පිනින් මතු මෙසේ වූ දිළිඳු කුලයෙක නුපදිම්වයි උතුම් වූ රජකුලෙහි උපදිම්වයි එසේ ඉපැදත් නැතැයි යන බසෙහි අර්ථ නො දනිම්ව යි... "

- මහානාම කුමාරයා විසින් අනුරුද්ධ කුමාරයාට මහණ වන ලෙස පැවසූ අවස්ථාවේ මහණ වීමේ දුෂ්කරතාව පිළිබඳ ව අනුරුද්ධ කුමරු පවසන වදන්වලින් පැවිදි දිවියේ ඇති දුෂ්කර බව පෙන්වා දී තිබේ.

  " බුදුන් කෙරේ මහණ වූ කල එක් වේලක් කැව මනා ල, එසේ වූ බතක් දොර දොර සිඟා ඇවිද ලද මනා ල... "

- මහානාම කුමරුගේ පැහැදිලි කිරීම් මත සහෝදරයා නොයවා තමා ම බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩී බුදුන් කරා පැවිදි වන්නට අනුරුද්ධ කුමරු තීරණය කිරීම
  " නුඹ මහණ වන්නට නොගොස් මා ම පළමු කොට මහණ වන ලෙස බුදුන් කරා යවාපුව මැනවැ... "

- අනුරුද්ධ කුමාරයා තම මව්තුමියට බුදුරදුන් කෙරෙහි ඇති ප්‍රීතිය දක්වන අවස්ථාව

  " ගංගාවෙහි නිකුත් මහදියවතුර මහමුහුදට මුත් අතරෙක නොරඳන්නා සේ මාගේ ශ්‍රද්ධා නමැති මහ වතුර සුගත්මහමුහුද වැද මුත් නොරඳා ම ය......... "

**සද්ධර්මාලංකාරය**

සද්ධර්මාලංකාරය ගම්පොළ අවධියේ දෙවන ධර්මකීර්ති සංඝරාජ හිමියන් විසින් රචනා කරන ලදි. සද්ධර්මාලංකාරයෙහි සිත් ඇදගන්නා වෘතාන්ත මාර්ගයෙන් සත්පුරුෂ ජනයා ධර්ම මාර්ගයට යොමු කරවීම කතුවරයාගේ ප්‍රධාන පරමාර්ථය විය.

- ස්වර්ණතිලකා පෙර ආත්මයේ මණ්ඩලාකාරයෙන් මල් පූජා කොට බුදුන්ගේ ගුණ වර්ණනා කරමින් ප්‍රාර්ථනාවක් කළ අවස්ථාව
- තම දියණිය මලසුන් නොසෝදා, මල්වලට පැන් ඉසින්නේ නැතිව මල් පූජා කළ බව දුටු මව දියණියට දෝෂාරෝපණය කිරීම
  "එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලසුන නො සෝධා කුමක් පිණිස මල් පිදී ද?"
- සත්ත්වයන්ගේ ක්ලේශ කාමයන් නිසා නොයෙකුත් ව්‍යසනයන්ට ලක්වන බව

  "ඒ ප්‍රියභාවාදි වූ පසින් විශේෂයෙන් ම මිදී සිටියා වූ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්ය ශ්‍රාවකාදී වූ විශුද්ධ සත්ත්වයන්ට කිසි ශෝකයකුත් නැත. භය සංත්‍රාසය යන දෙයක් ඒකාන්තයෙන් නැත් ම ය... "

- නන්දිය වෙළෙන්දාගේ භාර්යාව තුනුරුවන් සරණ ගිය තැනැත්තියක වීම

වෙළඳ භාර්යාව විසින් අමාත්‍යවරයා එවන ලද කාන්තාවන්ට ශරීරය, මරණය, ජීවිතය පිළිබඳ අනිත්‍ය දක්වමින් අදහස් ප්‍රකාශ කිරීම

"සියලු ආරොග්‍යතා ව්‍යාධි කෙළවර කොට ඇත්තේ ය. සියලු යෞවන ජරා අවසන් කොට ඇත්තේ ය. සියලු ජීවිත මරණ අවසන් කොට ඇත්තේ ය... "

- නන්දිය නම් වෙළෙන්දාගේ ශ්‍රද්ධා සම්පන්න බව

  "ඒ වෙළෙඳාණෝ ශ්‍රද්ධා සම්පන්නයහ."

- නන්දිය වෙළෙන්දා නිතර තුනුරුවන් කෙරේ පැහැදුණු මෛත්‍රී සම්පන්න අයෙකු බව

  "ඇම දෙනා ම සම්‍යක්සම්බුද්ධ වූ බුදුරජාණන් වහන්සේගේ නම කියා ශරණගත වව ..

**සුදුසු උදාහරණ දක්වමින් ලියා තිබීම ඉහළ ලකුණකට යාමට හේතු වේ.**
**(ලකුණු 15)**


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4. (අ) "සිංහල සන්දේශාවලියේ ස්වර්ණමය අවධිය වන්නේ කෝට්ටේ රාජධානි සමය යි." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 07 යි.)

(ආ) "වෑත්තෑවේ හිමියෝ රස නිෂ්පාදනයෙහි ලා අනුපම දක්ෂතාවක් ප්‍රකට කරති." මේ අදහස සුරඟන වැනුම ඇසුරෙන් පහදන්න. (ලකුණු 08 යි.)

4. (අ) සිංහල සංදේශාවලියේ ස්වර්ණමය අවධිය කෝට්ටේ සමය ලෙස හඳුනාගෙන තිබිය යුතු යි. සංදේශ කාව්‍ය බහුල වශයෙන් රචනා වූ අවධිය මේ බව වටහාගෙන උදාහරණ සහිත ව විස්තර කර තිබීම අවශ්‍ය වේ.

➢ සන්දේශ කාව්‍ය රචනා වීමට හේතු වූ පසුබිම
- දේව වන්දනය ජනප්‍රිය වීම
- රාජ ප්‍රශස්තියට නැඹුරු වීම
- කාව්‍ය රචකයන් අතර වූ තරගකාරීත්වය
  හංස සංදේශය හා ගිරා සන්දේශය ඒ අනුව රචනා වූ බවට මතයක් පවතී.
- ගිහි පැවිදි දෙපිරිස ම කාව්‍යකරණයෙහි නියුක්ත වීම
- කෝට්ටේ අවධියේ ගද්‍ය සාහිත්‍ය පසුබෑමට ලක් වූ යුගයක් බව
- පද්‍ය සාහිත්‍ය නිර්මාණ රාශියක් බිහි වීම
- ගිහි පැවිදි දෙපිරිස ම කාව්‍යකරණයෙහි නියුක්ත වීම
- ආරණ්‍යවාසී හා ග්‍රාමවාසී භික්ෂු පරම්පරා දෙකක් ක්‍රියාත්මක වීම නිසා පද්‍යකරණයේ විශාල උද්යෝගයක් දක්නට ලැබීම.

➢ මෙම අවධියේ ලියවුණු සන්දේශ ලෙස
- පරෙවි සංදේශය :- ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමි.
- සවන පැරකුම්බා රජුගේ දියණියක වන චන්ද්‍රාවතී කුමරියට යෝග්‍ය ස්වාමිපුරුෂයෙකු ලබා දෙන ලෙස ඉල්ලා උපුල්වන් දෙවියන්ට යවන ලද සන්දේශයකි
- සැළලිහිණි සන්දේශය :- ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් හයවන පැරකුම්බා රජුගේ දියණියක වන උලකුඩය දේවියට පුත්‍රුවනක් ලබාදෙන ලෙස ඉල්ලා විභීෂණ දෙවියන්ට යවනු ලබන සන්දේශයකි.
- ගිරා සන්දේශය :- කර්තෘ අවිනිශ්චිත වන මෙහි සවන පැරකුම්බා රජු තුමාත් ලංකාවේ බුද්ධ ශාසනයත් ආරක්ෂා කරන දෙන ලෙස නාථ දෙවියන්ට යවනු ලබන සන්දේශයකි.
- හංස සන්දේශය :- වීදාගම මහා මෛත්‍රෙය හිමියන්

රටටත්, රජයටත්, ජනතාවටත්, සතරමහා දෙවිවරුන්ටත් පිරිත් කියා පින් දී සෙත් පතන ලෙස පද්මාවතී පරිවේනාධිපති වනරතන මා හිමියන් වෙත යැවූ සන්දේශයකි.

- කෝකිල සන්දේශය :- දෙව්නුවර ඉරුගල්තිලක පිරුවන්පති හිමි

  සපුමල් කුමාරයා සහ ඔවුන්ගේ සේනාවට ආරක්ෂාව සලසා දෙන ලෙස දෙව්නුවර උපුල්වන් දෙවියන් අයැදීම

***(ලකුණු 07යි)***

(ආ)

- වෑත්තෑවේ හිමියන් රස නිෂ්පාදනයේ දී දැක් වූ ප්‍රතිභාව සුරඟන වැනුම ඇසුරින් විස්තර කර තිබිය යුතුයි.
- සුරඟනන්ගේ සම්ප්‍රාප්තිය චිත්ත රූප දනවන අයුරින් දැක්වීම
  " පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා "
- වීණා නාදයට අනුව තාලාන්විත රංගනයක් සිදු වූ බව
  "රූ රුසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා...."

- අවස්ථාවට උචිත ලෙස විරිත් සහ භාෂා භාවිතය

| | | |
|---|---|---|
| ළ ඟ ළ ඟ වා | උනුනට කරවා | දය |
| නො ව ර ද වා | වීණා පද වා | දය |
| ර ඟ අ ඟ වා | සුරඟන රඟ බේ | දය |
| සෙ ද ක ර වා | රජ සබය පබෝ | දය |
| ප ට න් | සුරිඳු දුන් උපදෙස් සිහි කො | ට |
| ඉ ට න් | බෙලෙන් දැමුවෙන් ගුළි අහස | ට |
| තු ට න් | වඩන සුර අඟනෝ බැසසි | ට |
| ප ට න් | ගත්තු නව සියයක් නැටුම | ට |

- සත්ත්ව/ දිව්‍ය /මනුෂ්‍ය යන තුන් ලොවෙන් ම පිරිස් වීණා වාදනයට තදින් බැඳී සිටි බව පෙන්වීම.

"පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කො ට"

- අවස්ථාවට උචිත පරිදි උපමා රූපක යොදා තිබීම
- ධ්වනිතාර්ථවත් භාෂා විලාසයක් යොදා ගැනීම
- පරිසරයේ ස්වාභාවික වස්තූන් වීණා නාදය සමග මුසුකොට වර්ණනාවට ලක් කොට තිබීම

සුදුසු උදාහරණ යොදා ගනිමින් ඉහත කරුණු තහවුරු කර තිබීම අපේක්ෂා කෙරේ.

*(ලකුණු 08යි)*

5. බැහැරින් අවතීර්ණ වූ විවිධ බලපෑම් හේතුවෙන් ජන ජීවිතය විනාශ මුඛයට පත් වූ ආකාරය බැද්දේගම නවකතාව ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය සමපූර්ණයෙන් ම මෙරටට බැහැරින් පැමිණියකි. එමගින් පාරම්පරික ජන ජීවිතය පරිහානියට පත්වීම බැදේගම නවකතාවෙන් නිරූපණය වේ.

- ඉංග්‍රීසි පාලනය හේතුවෙන් බැද්දේගම ජනයා අතර පැවති සබඳතා බිඳ වැටීම
- ඉංග්‍රීසි පරිපාලනයේ පහළ ම රාජ්‍ය සේවකයා, ආරච්චිල දූෂිතයෙකු වීම

"ගනු දෙනුව මුළුමනින් ම නීති විරෝධී වූවක් බව ආරච්චිල දැන සිටි නමුත් ඔහුගේ වුවමනාව ඊට වඩා බලවත් ව පැවතිණි. ප්‍රනාන්දුට ණය ව සිටින මුදලට ආරච්චිල තමාගේ කැමැත්ත විකිණීය..."

- ආරච්චිලගෙන් වූ අසාධාරණකම් සොයා බැලීමට, පාලනය කිරීමට කෙනෙකු නොවීම

"ලැයිසොමක් ගන්ඩ ඕනෑ ඒකයි ආණ්ඩුවේ නීතිය? කලින් මං කිව්වනෙ කෝරාළ තද මිනිහෙක් කියලා උන්නැහේ මා එක්කත් දැන් කේන්තියෙන් ඉන්නෙ.... "

- ණය බරින් මිනිසුන් පීඩාවට පත් කර තමන්ගේ අභිමතය ඉටු කර ගැනීමට ප්‍රනාන්දු මුදලාලි ක්‍රියා කිරීම.
- මුදල්, ධාන්‍ය, ඉඩම් පමණක් නොව පුංචිමැණිකා වැනි කාන්තාවන් තම ප්‍රයෝජනයට යොදා ගැනීමේ උත්සාහය.

" මිනිහ අත් හැරලා යන කතාවක් මෙතන නෑ. මම පොහොසත් මිනිහෙක්. උඹට සල්ලිත් රිදී රත්තරන් බඩුත් දෙන්ඩ මට පුළුවනි. ඒකෙන් උඹේ මිනිහට වෙන්නේ යහපතක්. එයාගෙ ණයත් නිදහස් කරලා පොරොන්දු වෙච්ච හැටියට හේන්වලින් අඩේකුත් දෙන්නම්." "ඉතින් උඹ රෑ වුණායින් පස්සේ වැටෙන් රිංගලා ආවට කාටවත් දැනගන්ඩ බෑ...."

- තමාට අවබෝධයක් නැති බැහැරින් පැමිණි නීතිමය ක්‍රියාදාමය යටතේ අසාධාරණ අයුරින් බබුන් සිරගත කිරීම.

" සුදු හාමුදුරුවො කිව්වා බරපතළ වැඩ් ඇතුව මාස හයයි" කියලා. ' මට ඒක හොඳට ඇහුණා. බරපතළ වැඩ ඇතුව මාස හයක් හිරේට" එච්චරම යි මට හරියට ඇහුණේ..."

***සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න***

*(ලකුණු 15)*



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6. "ළමා මනසෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ මනා අවබෝධයකින් යුක්තව ජේ. බී. සේනානායක වෙසක් පහන කෙටිකතාව නිර්මාණය කර ඇත." විමසන්න. (ලකුණු 15 යි.)

ළමා මනසේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මනා විවරණයක් වෙසක් පහන කෙටි කතාවෙහි දැකිය හැකි ය.

- විවිධ වයස් කාණ්ඩවලට අයත් දරුවන්ගේ මානසික ස්වභාවය නිරූපණය කර ඇත.

  "... ඔව් නංගී අපේ කූඩුව තරම් ලස්සන කූඩුවක් නැහැ..."

- වැඩිමහල් දරුවා නිර්මාණශීලී ලෙස වෙසක් පහන නිර්මාණය කිරීම
  "කෑම කන සාලයේ මේසය අසල බිම කඩදාසියක් එළා හිඳගෙන උණ කැබැල්ල පළා සිහින් පතුරුවලට ඉරන්ට විය.."
- බාල දරු දෙදෙනා අතරේ සිදුවන රණ්ඩු දබර
  "ඈ තමා හිඳ සිටි තැනින් නැගිට මා පිටිපසට ඇවිත් මගේ හිසට දැඩි සේ පහරක් ගසා ගෙට දිව ගියා ය..."
- උණ පතුරු සඳහා සිදුකරන රණ්ඩුව
  "(උණ) පතුරක කොණ ඇයගේ දෙදන අතරින් මෑත් වී තිබෙණු මා දුටුවේ එවිට ය. මම එය ඇද මා අසලින් තබා ගතිමි...."
- අලුත් ගවුමක් ඇඳ පැමිණි නැගණිය හැඬවීම
  "පියරු දැම්මට මුහුණේ ගඳ යනවද..."
- අම්මාගේ පහර කෑමෙන් පසුව දෙදෙනා නැවත සහයෝගයෙන් කූඩුව බැලීමට යෑම
  "අයියේ කූඩුව බලන්ට යමු' යි කීවා ය. මම කිසිවක් නොකියා හිඳ සිටි තැනින් නැගිට අම්මා ඇත්දැ යි වටපිට බලා නංගී සමග මිදුලට බැස්සෙමි ..."
- නිර්මාණශීලීත්වය සඳහා ඇති උද්යෝගය
  වෙසක් පහන නිර්මාණය කිරීමේ විවිධ අවස්ථා උදාහරණ ලෙස හැකි ය
- අව්‍යාජ බව හා දරුවන්ගේ නොදැනුවත් බව
  අයියාගේ අත පිලිස්සීම නිසා අයියා මිය යාවි යැයි සිතීම

  "කරත්තය පමා වන්නේ අයියා දොස්තර ගෙදර දී මළ හෙයිනැ'යි මට සිතිණ'

- දරුවන් අතර ඇති සංවේදී බව හා කරුණාව

  "අයියාගේ බැනියමට ගිනි ඇවිලුණු විට නංගීත් මාත් ආරම්භ කළ හැඬුම අපි නොනැවැත්වීමු"

- අයියා වෙනුවෙන් දුක් වන ආකාරය,
- පසුතැවිලි වීම හා බියජනක ස්වභාවය
- තමා නිසා අයියා තුවාල වීමට හේතු වූ බව සිතීම පසුතැවිල්ලට පත්වීම
- ආවේගශීලී ස්වභාවය
- එකිනෙකා අතර කෝප ගන්නා අවස්ථා මතු කර දැක්වීම

*සමස්තය සලකා ලකුණු ලබා දෙන්න*

*(ලකුණු 15 යි)*

7. "නිදහස් කවියේ ද්විතීය තරංගයට/දෙවන පරපුරට අයත් කාව්‍ය නිර්මාණ මගින් කාලීන සමාජ යථාර්ථය මැනවින් නිරූපණය වේ." නිර්දිෂ්ට කාව්‍ය සංග්‍රහයෙහි අන්තර්ගත පද්‍ය පන්ති තුනක් ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ලකුණු 15 යි.)

නිදහස් කවියේ ද්විතීය තරංගයට අයත් කවීන් වස්තු විෂය තෝරාගැනීමේ දී සමාජ යථාර්ථය විවරණය කිරීමට දැරූ උත්සාහය පිළිබඳ මනා දැනුමක් මෙහි දී අපේක්ෂා කෙරේ. මෙම ප්‍රකාශය පද්‍ය පන්ති තුනක් ඇසුරින් විග්‍රහ කළ යුතු ය.

- මොනිකා රුවන් පතිරණ - පොඩි දුව
  දරිද්‍රතාව නිසා සමාජය විසින් දැරියක වෙත එල්ල කරන ලද විවිධ හැඳින්වීම් හමුවේ පීඩා විඳින ආකාරය සමස්ත සමාජය මුල් කර ගනිමින් නිරූපණය කිරීම

  පොඩි දරුවෙකු අතින් අරන් පාසැලකට මං යනකොට
  එතන හිඳින අය කිව්වේ බේබිගේ ආයම්මා කියලා

- දයාසේන ගුණසිංහ - රත්තැටියක කඳුළු
  මවගේ කුස තුළ සිටින දරුවෙකු බිහි වන අවස්ථාවේ එම දරුවා මියයාම කරණකොට ගෙන පියෙකුගේ සිතෙහි ඇති වූ දාරක ස්නේහය සමග ඇති වන්නාවූ අනුවේදනීය මනෝභාව

  දස එකඩ මසක් ඈ රැකි
  සෙනෙහසේ නිධානය
  වෙස් මුහුණු තුළට වූ බහිරවයින්
  නුහුරුබස් තෙපලමින්
  වට වෙමින් අඩු නියෙන්
  පැහැර සඟවන අතර
  බලා සිටියෙමි කොනක
  ගොළු වෙමින් අසරණව

- රත්න ශ්‍රී විජේසිංහ - පරමල්
  නූතන පරපුර විසින් වැඩිහිටියන් කෙරෙහි දක්වන ලද ආකල්පය කවියා දකින ආකාරය

  පඩි පෙළින් බැස අයින් වී එන්න
  අලුත් මල් පොකුරු අරගෙන එන්න
  පින්වතුනි, එන අයට ඉඩ දෙන්න
  එපා පරමල් පයින් පාගන්න

- නන්දන වීරසිංහ - ආදරණීය පාසල
  දක්ෂයාට පමණක් අවස්ථාව ලබාදෙන තමන් වැනි පසුපෙළ සිටි සිසුන් නොසලකා හරිනු ලැබූ පාසල දෙස කවියා උපහාසයෙන් බලන අයුරු

  පසුපස ම අසුන්වල
  අප වෙත සුරත දිගු කොට
  'බැරි එවුන්' යැයි
  හෙළා දුටු එදවස
  ඉදිරි පෙළ සිසු න්ඩය
  සරදම් සිනා දී
  ප්‍රීති සිත් වියරු කළ තැන
  මගේ ශුද්ධ වූ පාසල !

- ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර
  කවියා ස්වාභාවික වස්තූන් දෙකක් පාදක කරගෙන පන්ති විෂමතාවයේ යථාර්ථය පෙන්වීමට උත්සාහ ගැනීම

  තණ පඳුරක් මි
  මතු වෙමි
  බිම් ගැබින්
  දුබල
  නොගැඹුරු
  මුල්
  මතින්


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ධර්මසිරි රාජපක්ෂ - නාංගිගේ රහසිගත සෙනෙහෙ වීණාව
  ගමෙන් පිට වී දිවි ගෙවන කවියා ගම්මානයේ සුන්දරත්වය හා නැගෙණියගේ ජීවිතය පිළිබඳ ව ළත වෙමින් සිටින ආකාරය

  කුප්පි ලාම්පුවේ දැල්ල මිලින කොට
  පිඟන් කටු කැල්ලක් ගෙන
  කිරි පිහිය මුවහත් කරමින

ඉහත පද්‍ය පන්ති අතුරින් පද්‍ය පන්ති තුනක්වත් තෝරා ගෙන උදාහරණ සහිත ව සමාජ යථාර්ථය විවරණය කරමින් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. උදාහරණ සඳහා පද්‍ය පන්ති දෙකක් හෝ එකක් පමණක් තෝරා ගෙන නැත්නම් ඊට අනුරූප ලකුණු ලබා දෙන්න.

*(ලකුණු 15 යි)*

8. "මූලාශ්‍රයෙහි වූ නිර්මාණාත්මකභාවය විශිෂ්ට නාට්‍ය කෘතියක් බිහි කිරීම සඳහා කර්තෘවරයාට මහා පිටුබලයක් වූයේ ය." පෙමතො ජායතී සොකො නාට්‍යය ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 15 යි.)

මූලාශ්‍රයෙහි වූ නිර්මාණාත්මක භාවය විශිෂ්ට නාට්‍ය කෘතියක් බිහිකිරීම සඳහා මහා පිටුබලයක් වූ බව ස්වර්ණතිලකා කථා වස්තුව මූලාශ්‍රය කොටගත් "පෙමතො ජායතී සොකො" නාට්‍ය නිර්මාණය තුළින් පිළිබිඹු වේ.

පුරාතන ගද්‍ය කෘතියක වූ කථා වස්තුවකින් නාට්‍යෝචිත අවස්ථා මැනවින් උකහා ගෙන එදිරිවීර සරච්චන්ද්‍ර පෙමතෝ ජායතී සෝකෝ නාට්‍යය නිර්මාණය කළ බව

- මූලාශ්‍රයේ සඳහන් කතා පුවත නාට්‍යයට ගැලපෙන ලෙස වෙනස් කර ගනිමින් කලාත්මක ව නිර්මාණය කර ඇති බව

  මූලාශ්‍රය : "ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශෝකයෙන් දාහ ලත් ශරීර ඇතිව හුණු වූ ආශ්වාස ප්‍රාශ්වාසයෙන් පිරුණු..."

  නාට්‍යය : මැණික නම් මැණික වේ
  කිළුටු පස් යට තිබී ලැබුණ මුත්
  මැණික නම් මැණික වේ
  අගය දත් නැණතිතෝ
  නොබුදා හරිති කිසි ලෙද

- මූලාශ්‍රයේ සඳහන් සාම්ප්‍රදායික බමුණෙකුගේ ස්වරූපය නාට්‍යයේ දී ප්‍රේමය හමුවේ සපුරා වෙනස් වූ ආකාරය නාට්‍යානුසාරයෙන් දක්වා ඇති බව

  නොදොඩනුය මෝඩ බස්
  ස්වර්ණතිලකා ලඳුනි
  පිරිසිදු වූ බමුණෙකැයි
  උද්දච්ඡ වී හුනිම්

  යෞවනයේ සුවඳ මල් ද
  යෞවනයේ මිහිරි පල ද
  සරසවියගෙ පුදසුන මත
  මැලවී ඇත තිබූ අයුරු

- චරිත නිරූපණයේ දී මූලාශ්‍රයේ ස්වර්ණතිලකාගේ ස්වභාවයත් නාට්‍යයේ දී ස්වර්ණතිලකාගේ ස්වභාවයත් වෙනසකට බඳුන් වී ඇති බව

  "මම ඉඳින් සැබවින් ම ගැහැණියක් වීම් නම් ඒ උදාර බ්‍රාහ්මණයා හා වාසය කෙරෙමමය"

- අවස්ථා නිරූපණයේ දී මූලාශ්‍රය අතික්‍රමණය කරමින් ස්වර්ණතිලකා පරිණත ව හැසිරෙන ආකාරය දක්නට ලැබේ.

නෙවෙමි සම ඔබ බිරිඳ තනතුරට
ඇදුරිඳුනි, මම සැඩොල් දුවක් වෙමි
හීන කුලයේ උපන්
උභය කුල පරිශුද්ධ
බමුණෙක්ය ඔබ තුමා
ලෝ පසිඳු පඬිතුමෙකි
ලත් නොමද කිත් යසස්
සිප් නොදත් ලද බොළඳ කතකි මං

- අවස්ථා නිරූපණයේ දී, නිර්මාණාත්මක ව නාට්‍යයට උචිත ආකාරයෙන් යොදා ගෙන ඇති බව (මූලාශ්‍රය හා පෙමතෝ ජායතී සොකෝ නාට්‍යයෙන් සුදුසු පරිදි නිදසුන් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න) මූලාශ්‍රයෙන් උදාහරණ යොදා ගෙන නොතිබුණ ද සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.

*(ලකුණු 15 යි)*



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

## 71 - සිංහල II

### ලකුණු බෙදීයෑම

### II පත්‍රය

I කොටස (පළමු ප්‍රශ්නය) : මෙම ප්‍රශ්නය වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.)

II කොටස : මෙම කොටස ප්‍රශ්න 07කින් සමන්විත වේ. දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර සම්පූර්ණ 04කට පිළිතුරු සැපයිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| 02 ප්‍රශ්නය | : | අවබෝධය | - | ලකුණු 12 (02 x 6 = 12) |
| | | සාරාංශය | - | ලකුණු 13 (02 + 03 + 08 = 13) |
| 03 ප්‍රශ්නය | : | රචනය | - | ලකුණු 25 |
| 04 වන ප්‍රශ්නයේ සිට 08 වන ප්‍රශ්නය තෙක් පිළිතුරු සඳහා | | | - | ලකුණු 15 |

**(II වන පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 25 + 25 + 15 + 15 = 100)**

| | | | |
|---|---|---|---|
| I කොටස (පළමු ප්‍රශ්නය) | 1 x 20 | = | 20 |
| II කොටස (දෙවන ප්‍රශ්නය) | 25 + 25 | = | 50 |
| 4 - 8 දක්වා ප්‍රශ්නවලින් 2 ක් | 15 x 2 | = | 30 |
| | | | 100 |

| | | |
|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| **අවසාන ලකුණු** | = | **200 ÷ 2 = 100** |

## අභිමතාර්ථ

II පත්‍රය - I කොටස

සිංහල අක්ෂර මාලාව, ඊට අයත් විවිධ ප්‍රභේද, පද සංයෝජනය, උක්තාඛ්‍යාත රීති හා භාෂාවේ ප්‍රමුඛ ව්‍යාකරණාංග පිළිබඳ විභාග අපේක්ෂකයන් සතු අවබෝධය විමර්ශනය කිරීම මින් අපේක්ෂිත ය.

II පත්‍රය - II කොටස

අපේක්ෂකයන් සතු සංශ්ලේෂණ හා විශ්ලේෂණ ශක්‍යතාව ද විචාරශීලී චින්තනය, නිර්මාණාත්මක කුසලතා මෙන් ම අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අර්ථාවබෝධය මැන බැලීම ද වාක්‍ය රීති, ප්‍රමුඛ ව්‍යාකරණාංග හා ශිල්පීය ලක්ෂණ පිළිබඳ කුසලතා විමර්ශනය කිරීම ද මේ කොටසින් අපේක්ෂිත ය.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

AL/2025/71/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ..........................

**උපදෙස්:**

- ※ **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඤ, ණ, න, ත, ඉ, ම, ප
(2) බ, ය, ඨ, ආ, ක, ච, ට
(3) ම, හ, බ, එ, ප, උ, ඌ
(4) ක, බ, ච, ට, ත, ඉ, ඊ
(5) ශ, ෂ, ස, හ, ෆ, ඍ, ඎ (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) සම්ප්‍රේශණය, කළටි, උච්චාවස්ථාව, බොළඳ, සුලැඟිල්ල
(2) සම්ප්‍රේෂණය, කලටි, උච්ඡාවස්ථාව, බොලඳ, සුළැඟිල්ල
(3) සම්ප්‍රේෂනය, කළටි, උච්චාවස්ථාව, බොළඳ, සුළැඟිල්ල
(4) සම්ප්‍රේසනය, කලටි, උච්ඡාවස්ථාව, බොලඳ, සුලැඟිල්ල
(5) සම්ප්‍රේෂණය, කළටි, උච්චාවස්ථාව, බොළඳ, සුළැඟිල්ල (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) පැරකුම්බා, විජයබාහු, කිත්සිරිමෙවන්, රාජසිංහ, දුටුගැමුණු
(2) කිත්සිරිමෙවන්, දුටුගැමුණු, පැරකුම්බා, රාජසිංහ, විජයබාහු
(3) කිත්සිරිමෙවන්, පැරකුම්බා, විජයබාහු, රාජසිංහ, දුටුගැමුණු
(4) විජයබාහු, දුටුගැමුණු, පැරකුම්බා, කිත්සිරිමෙවන්, රාජසිංහ
(5) රාජසිංහ, විජයබාහු, පැරකුම්බා, දුටුගැමුණු, කිත්සිරිමෙවන් (......)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) අනුස්වාර දෙකක් එක ළඟ එක යෙදිය හැකි ය.
(2) අනුස්වාරයට පිල්ලම් එකතු කළ හැකි ය.
(3) අනුස්වාරය ස්වරයකට පසු ව ම යෙදිය යුතු ය.
(4) අනුස්වාරය වචනයක මුලට යෙදේ.
(5) අනුස්වාරය ලිවීමේ දී 'අ' යන්නක් භාවිත කිරීම අනිවාර්ය ය. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ප්‍රායෝගික පරීක්ෂණ, අකාල වර්ෂාව, පුළුල් ක්ෂේත්‍රය, කාලීන අවශ්‍යතා
(2) කර්මාන්ත අමාත්‍ය, නිසල දිය, භූමි කම්පාව, ව්‍යවස්ථා විරෝධී
(3) තාක්ෂණික විෂය, වාචික පිළිතුරු, පාසල් අධ්‍යාපනය, වෘත්තීය සුදුසුකම්
(4) සෙල්ලම් ගෙය, විභාග ලකුණු, ආරාධනා පත්‍ර, ප්‍රාමාණික වියත්හු
(5) ද්විතීය අදියර, අන්තර්ගත කරුණු, ඉගෙනුම් කුසලතා, විදේශ රැකියා (......)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ශ්‍රමණ, විමන, භ්‍රමණ, අශුන
(2) භූෂණ, මෝරන, ධාරණ, රඟන
(3) විචාර, කුමාර, කෑදර, ප්‍රචාර
(4) අශ්ව, නිශ්චල, ආශ්චර්ය, විශ්ව
(5) විනාශ; ප්‍රකාශ, ප්‍රදේශ, දෑස (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සයුරු, කුරිරු, ගැඹුරු, ප්‍රවර
(2) ප්‍රහාර, තුසර, හසර, වසර
(3) අඹ, දඹ, ලඹ, තඹ
(4) දුහද, සුහද, විෂාද, ප්‍රසාද
(5) ආලාප, ප්‍රලාප, අලස, විලස (......)

1.8 කම් විබත්, සබඳ විබත්, කරණ විබත් සහ අවදි විබත් යන සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) හිරුරැස්, මිණිපලඟ, ගත්කරු, ගිනිබිය
(2) ගත්කරු, ගිනිබිය, හිරුරැස්, මිණිපලඟ
(3) මිණිපලඟ, ගිනිබිය, හිරුරැස්, ගත්කරු
(4) ගිනිබිය, හිරුරැස්, මිණිපලඟ, ගත්කරු
(5) ගත්කරු, හිරුරැස්, මිණිපලඟ, ගිනිබිය (......)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පූජිත, පෝෂිත, භාවිත, භාෂිත
(2) දරණ, පරණ, මරන, උරන
(3) දැරූ, පිරූ, බිරූ, තෙරූ
(4) විඳින, බිඳින, අඳින, බඳින
(5) පිපිරීම, දෙදරීම, මැකිරීම, වැකිරීම (......)

1.10 පහත දක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**පාලා** ගිය වැනි බහුරු කෝලම්"
(ආ) "**කියව** පුළුවන් ද වෙණ වැයුමා"
(ඉ) "**සැරද** හස රද සඳ"
(ඊ) "**බඳිමින්** දනමන නුවරු"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(2) ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (......)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ධර්මිෂ්ඨ, කනිෂ්ඨ
(2) මාණික්‍යමය, ස්වර්ණමය, ශෛලමය, ලෝහමය
(3) සැහැලි, කැබැලි, වැදැලි, කැදැලි
(4) යකකු, බඹකු, සොරකු, ඇතකු
(5) දෛනික, වෛකල්පික, නෛතික, ඓතිහාසික (......)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) නිශ්ශබ්ද, නිශ්ශංක, නිශ්චල, නිශ්ශෝභා
(2) විගමන, විසංයෝග, විප්‍රයෝග, විසම්මුති
(3) ප්‍රමෝද, ප්‍රබෝධ, ප්‍රකම්පන, ප්‍රවර්ධන
(4) සුනීල, සුධීර, සුශීල, සුළඟ
(5) පිළිතුරු, පිළියම්, පිළිසකර, පිළිවදන් (......)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) මෙන්, විසින්, වෙනුවෙන්, සඳහා
(2) පිණිස, ලෙස, දෙස, මිස
(3) තුරු, වගේ, යළි, පටන්
(4) සහ, දක්වා, නිති, විනා
(5) කැටුව, ඉක්බිති, හැර, සමග (......)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

1.14 "තමාගේ රට පිළිබඳ **අභිමානය** ද **සෞභාග්‍යය** ද කෙනකුගේ **දේශානුරාගය** කෙරෙහි හේතු වේ." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) තද්ධිත, සන්ධි, උපසර්ග　　(2) සන්ධි, උපසර්ග, තද්ධිත
(3) සන්ධි, තද්ධිත, උපසර්ග　　(4) තද්ධිත, උපසර්ග, සන්ධි
(5) උපසර්ග, තද්ධිත, සන්ධි　　(......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කෙරෙන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) ගසන්නෝ ය, දෙසන්නෝ ය, නසන්නෝ ය, අසන්නෝ ය
(2) දමාලා, නමාලා, වමාරා, හමනා
(3) පැන්නේ ය, ඇන්නේ ය, දෙන්නෝ ය, කන්නේ ය
(4) දෙති, ගති, එති, යති
(5) කළ, පල, බල, මළ　　(......)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සුබස්, සුමිත්, සුදම්, සුරත්　　(2) ළමාපොත්, මහලුනිවාස, බදුසහන, අලිවැට
(3) අනදර, අරමුණු, අතලස, අනන්ත　　(4) සත්මහල්, තුන්දොස්, දසරජදම්, දෙනුවන්
(5) නෙතුපුල්, පාකමල්, හදවිමන, දම්අමා　　(......)

1.17 එක ම වර්ගයට අයත් **සන්ධි** පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පොල්ලත්ත, ගොක්කත්ත, අල්ලස, රුක්කත්තන
(2) උනුන්, ඔවුනොවුන්, සිහසුන්, මුලසුන්
(3) සුවැති, සිරිතැති, දැනුමැති, හදැති
(4) කොග්ගල, හග්ගල, උග්ගස්, දුග්ගන්නා
(5) සිද්ධාලේප, සහනාලේප, ප්‍රබන්ධෝපදේශ, ලලනාධිපත්‍යය　　(......)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය කුමක් ද?

(1) සුරකුම්, සුදිලුම්, සුපැතුම්, සුසැදුම්
(2) නිරර්ථක, නිරපේක්ෂ, නිරාකුල, නිරුත්තර
(3) සරණ, ඉරන, වරන, කිරන
(4) විවාදාපන්න, ස්වරාරෝහණ, විරෝධාකල්ප, රාජ්‍යායතනය
(5) ත්‍යාගවන්ත, ප්‍රඥාවන්ත, ශ්‍රද්ධාවන්ත, ධනවන්ත　　(......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) අසංවේදී පුද්ගලයෝ සමාජ හිතකාමීහු නො වෙති.
(2) නායකයෝ රටේ දියුණුව ඇති කරති'යි ජනතාව දෑස් දල්වා බලා සිටිති.
(3) ඉදිරියෙන් ම දුවන්නී අප පාසලේ ක්‍රීඩා නායකයා ය.
(4) මම මෙන් අනිකා වෙනුවෙන් කැප වී වැඩ කරන්න.
(5) අප සුදනන් මෙන් හැසිරිය යුත්තෙමු.　　(......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) අනුන්ගේ ඇද-කුද හොය හොයා ඉන්නෙපා.
(2) වහෙන් ඔරෝ නැතුව කියන දෙයක් කෙළින් කියන්න.
(3) අපාරාධකරුවා පෝරකයට නගිනු අපි බලා සිටියෙමු.
(4) අම්මයි තාත්තයි මායි අද උදේ පාන්දර ම වෙලට ගියා.
(5) මං කඩේ ගාවට යද්දී ඔක්කොම දුවගෙන ආවා.　　(......)

(ලකුණු 20 යි.)

* *

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

### II පත්‍රය

විෂය අංකය / பாட இலக்கம்: **71**    විෂයය / பாடம்: **සිංහල**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 3 | 11. | 3 |
| 02. | 5 | 12. | 4 |
| 03. | 2 | 13. | 2 |
| 04. | 3 | 14. | 5 |
| 05. | 2 | 15. | 1 |
| 06. | 4 | 16. | 3 |
| 07. | 3 | 17. | 4 |
| 08. | 5 | 18. | 3 |
| 09. | 2 | 19. | 1 |
| 10. | 4 | 20. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රටක වෘක්ෂලතාදිය ඇති වන්නේ එහි දේශගුණය, පස ආදි භූගෝලීය සාධකයන් මුල් කරගෙන ය. තව ද ඒ වෘක්ෂලතාදිය අනුව ඒ රටේ ඉතිහාසයත් එක්තරා ප්‍රමාණයකට හැඩ ගැසෙන බව ද කිව යුතු ය. මනුෂ්‍යවාසයන් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවල ය. මිනිසා වෘක්ෂලතාදිය කෙරෙහි මුලින් ම සැලකිල්ල දැක්වූයේ ආහාර, වස්ත්‍ර සහ නිවාසස්ථාන ද සඳහා ඒවා ප්‍රයෝජනවත් වන බව පෙනුණු හෙයිනි. පසු ව ශාක විශේෂ කිහිපයක ඖෂධීය ගුණ ද අත්හදා බැලීම්වලින් සොයා ගන්නා ලදි. පුරාතන වෛද්‍යවරු දිවයිනේ සියලු බෙහෙත් පැළෑටිවල ම විස්තර දැක්වීමට වෑයම් කළහ. ඒ විස්තර නිඝණ්ඩු නමැති පොත්වල දක්නට ලැබෙයි.

මිනිසා අවට ඇති මල් ගස්වල සහ මල් පඳුරුවල ද සුන්දරත්වයත් සුගන්ධයත් ඔහුගේ සෞන්දර්ය හැඟීම දියුණු වීමට ඉවහල් විය. ශාක ලෝකයේ දක්නට ලැබෙන ගූඪ ස්වභාවය මිනිස් සිතෙහි ආගමික හැඟීම් පැන නැඟීමට හේතු වන කරුණුවලින් එකකි. භාවනාවට ඉතා සුදුසු තත්ත්වය ශාන්ත, නිශ්චල වනයෙහි ඇති බව දාර්ශනිකයා දුටුවේ ය. උද්‍යානයේ සෞන්දර්යය කවියා කුල්මත් කරන සුළු ය. එහෙයින් මේ පොතේ අග පරිච්ඡේදවලින් අනාවරණය කරනු ලබන සියවස් ගණනක ඉතිහාසයට සම්බන්ධ පුද්ගලයන්ට ස්වභාව ධර්මය විසින් මග පිළියෙල කර දෙනු ලැබූ අයුරු සලකා බැලීම මේ දිවයිනේ ඉතිහාසය හදාරන්නන්ගේ යුතුකමකි.

පහත රට සදාහරිත වැසි වනාන්තර වනාහි මහල් කිහිපයක් ඇති ඝන උද්භිද ප්‍රජාවකි. මෙහි ඇතැම් ප්‍රමුඛයෝ වනහිස විනිවිද වැඩෙති. ඔවුහු උසින් අඩි 100කට ද වැඩි වෙති. මේ ගස්වල පාමුල දක්නට ලැබෙන ලක්ෂණයක් නම් කයිරු ඇති වීම ය.

(i) මිනිසා වෘක්ෂලතාදිය කෙරෙහි මුලින් ම සැලකිල්ල දැක්වූයේ කවර හේතු නිසා ද?
(ii) මේ ඡේදයට අනුව අඩි 100කට වඩා උසින් යුත් ගස්වල ඇති ලක්ෂණය කුමක් ද?
(iii) රටක වෘක්ෂලතාදිය හට ගැනීමට බලපාන සාධක කීයක් මෙහි දැක්වේ ද?
(iv) පහත රට සදාහරිත වැසි වනාන්තර මෙහි හඳුන්වා ඇත්තේ කවර ආකාරයෙන් ද?
(v) මේ ඡේදයෙහි දැක්වෙන ආකාරයට නිඝණ්ඩු නම් කෘති විශේෂයෙහි අන්තර්ගත වන්නේ මොනවා ද?
(vi) මිනිස් සිතෙහි ආගමික හැඟීම් පැන නැගීමට බලපෑ හේතු සාධකය ලෙස මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(ලකුණු 02 × 6 =12 යි.)

(2) (අ)

(i) ආහාර, වස්ත්‍ර සහ නිවාසස්ථාන සඳහා ප්‍රයෝජනවත් වන බැවින්
(ii) ගස් පාමුල කයිරු ඇතිවීම ('වනහිස විනිවිද වැඩීම' යන්න ඇත ද ලකුණු ලබා දෙන්න)
(iii) දෙක යි. (සංඛ්‍යාත්මක ව නො දක්වා කරුණු දෙක දක්වා තිබේ නම් 01 ලකුණකි. එක් කරුණක් පමණක් ලියා ඇත් නම් ලකුණු ප්‍රදානය නො කෙරේ.)
(iv) මහල් කිහිපයකින් යුත් ඝන උද්භිද ප්‍රජාවක් වශයෙනි.
(v) සියලු බෙහෙත් පැළෑටිවල විස්තර
(vi) ශාක ලෝකයේ දක්නට ලැබෙන ගූඪ ස්වභාවය

*(ලකුණු 02 x 06 = 12 යි.)*

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සිංහල කවිය පිළිබඳ ව පැහැදිලි චිත්‍රයක් මතුකර ගත හැකි මුල් ම කාව්‍ය සංග්‍රහය ලෙස සීගිරි කැටපත් පවුරේ සටහන් කොට ඇති ගී සමුච්චය හැඳින්විය හැකි ය. ඉන් වැඩි කොටසක් කිතුවසින් අටවන, නවවන හා දසවන සියවස්වල හෙවත් අනුරාධපුර යුගයේ අවසාන භාගයට අයත් ය. සීගිරියේ කැටපත් පවුරේ කුරුටුගා ඇති මෙම ගීවලින් කියවෙන්නේ සීගිරිය නැරඹීම සඳහා දිවයිනේ නා නා පෙදෙසින් පැමිණි රසඥයන් එහි බිත්තිවල සිත්තම් කළ කතුන් දැකීමෙන් ද අවට පැතිර පැවති ශෝභාවට වශීකෘත වීමෙන් ද සිය හදවත්වල ජනිත වූ මනෝභාව ගීයට නැංවීමෙන් මෙම පද්‍යාවලිය බිහි වී ඇති බව ය. මේ පද්‍ය අතර එළිසම කොට බඳනා ලද පද්‍ය කිහිපයක් ද දක්නට ලැබේ. එහෙත් පද්‍ය වැඩි සංඛ්‍යාවක් ම 'ගී' නම් වීරිතින් රචනා කොට තිබේ. මේ හැරෙන්නට යහ ගී, පියුම් ගී, මත්වල ගී, කව් ගී, උමතු ගී, දුවඟ ගී, යොන් ගී ආදි වීරිත්වලින් බඳනා ලද පද්‍ය වේ.

මෙසේ නොයෙක් ගී වීරිත්වලට අනුව කුරුටුගාන ලද ගී 685ක් පරණවිතාන සූරීන් විසින් පිටපත් කොට ප්‍රකාශනයට පත් කරනු ලැබ තිබේ. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ නම් පද්‍ය රචනයෙහි ලා එදා සමාජයේ කෙතරම් වැදගත් තැනක් පැවතුණේ ද යන්න යි. යම් වස්තුවක සුන්දරත්වයෙන් තුල්මත් ව තමා වින්දනය කළ සුන්දරත්වය පද්‍යයක විලාසයෙන් ඉදිරිපත් කිරීමෙහි කවීන් නිරත වූ සමාජයක තතු සීගිරි කවිවලින් කියැවේ. කාව්‍ය රචනය මෙතරම් ප්‍රචලිත වූ සමාජයක් එදා පැවතියේ මුද්‍රණ ශිල්පය, පුවත්පත් වැනි පහසුකම් නොතිබුණු අවස්ථාවක බව සිතන විට ලාංකේය ජනතාව කෙතරම් දුරට කලාත්මක චින්තනය අතින් සංවර්ධනය වී සිටියේ ද යන්න මනාව වටහා ගත හැකි ය.

(ලකුණු 13 යි.)

(ආ) පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතු ය.

70-80

- සීගිරි කැටපත් පවුරේ ගී සමුච්චය සිංහල කවියේ මුල් ම කාව්‍ය සංග්‍රහය බව හා එය අනුරාධපුර අවධියේ අවසන් භාගයට අයත් බව
- දිවයිනේ නන් දෙසින් පැමිණි රසඥයන් සීගිරි බිතු සිතුවම්හි කතුන් හා අවට ඇති පාරිසරික සුන්දරත්වය දැක හදෙහි ජනිත මනෝභාවයන් ගීයට නගා තිබීම
- එළිසමය සහිත පද්‍ය කිහිපයක් මෙන් ම ගී, යහ ගී, පියුම් ගී, මත්වල ගී, කව් ගී, උමතු ගී, දුවඟ ගී, යොන් ගී ආදි විවිධ වීරිත්වලින් යුතු පද්‍ය 685ක් ප්‍රකාශනයට පත් කර තිබීම
- එකී පද්‍ය නිර්මාණය කළ කවීන් ජීවත් වූ සමාජයේ තතු සීගිරි ගීවලින් කියැවෙන බව
- මුද්‍රණ ශිල්පයත් පුවත්පත් පහසුකමත් නොතිබුණු අතීතයේ ලාංකේය ජනයාගේ කලාත්මක චින්තනයේ සංවර්ධිතභාවය පද්‍යවලින් හෙළිවීම

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇති නම් සමස්තයෙන් ලකුණු 2ක් අඩු වේ. වචන සංඛ්‍යාව 70 - 80 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් වචන ප්‍රමාණයට නියමිත ලකුණු 2ක අඩු වේ.

| | |
|---|---|
| *සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට* | *- ලකුණු 02 යි.* |
| *භාෂා නිරවද්‍යතාවට* | *- ලකුණු 03 යි.* |
| *අන්තර්ගතයට* | *- ලකුණු 08 යි.* |
| *මුළු ලකුණු* | *- 13 යි.* |



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ඩිජිටල්කරණය මගින් අත්විය හැකි යහපත් සහ අයහපත් ඵලවිපාක
(ii) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලංකාවේ අනාගත අපේක්ෂා
(iii) මෙරට ළමා සාහිත්‍ය නිර්මාණකරුවන්ට විධිමත් පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාව
(iv) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නගා සිටුවීමට අනුගමනය කළ යුතු අභිනව ක්‍රමෝපාය
(v) අඩු ආදායම්ලාභීන්ට අඛණ්ඩ ව මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ උචිත-අනුචිතභාවය

(ලකුණු 25 යි.)

250- 400

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශිකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

★ විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

*(ලකුණු 25 යි.)*

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් පමණක් නිදොස් කොට ලියන්න. නිදොස් නම් එම වාක්‍යය නැවත ලියන්න.

(i) හෙළයේ මහ ගත්කරු නොහොත් මාර්ටින් වික්‍රමසිංහ 'මඩොල්දූව' රචනා කළේ ය.
(ii) නිදහස් සටනට පණ පෙවූවෝ ජාතික වීරයන් වෙති.
(iii) විභාග ශාලාවෙහි නිරීක්ෂකයෝ ඇත.
(iv) අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ශිෂ්‍යයෝ ඇගයීමට ලක් කෙරෙති.
(v) රටවැසියනි, අසරණ පිළිකා රෝගීහු උදෙසා මුදලක් පරිත්‍යාග කරන්න.

4. (අ)

(i) හෙළයේ මහ ගත්කරු හෙවත් මාර්ටින් වික්‍රමසිංහ 'මඩොල්දූව' රචනා කළේ ය.
(ii) නිදහස් සටනට පණ පෙවූවෝ ජාතික වීරයෝ වෙති.
(iii) විභාග ශාලාවෙහි නිරීක්ෂකයෝ ඇත. (නිවැරදි ය.)
(iv) අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ශිෂ්‍යයෝ ඇගයීමට ලක් කෙරෙති. (නිවැරදි ය.)
(v) රටවැසියනි, අසරණ පිළිකා රෝගීන් උදෙසා මුදලක් පරිත්‍යාග කරන්න.

*(ලකුණු 01 x 05 = 05 යි.)*

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) සමහරු වගකිව යුතු තනතුරු සඳහා තම අනුගාමිකයන් පත් කරති.
(ii) ළමයි මේ දිනවල සරුංගල් සාදති.
(iii) රජතුමා තොප යුද පෙරමුණට යැව්වේ ය.
(iv) වංචනිකයෝ කිහිප වතාවක් අප මුළාවේ හෙළුවෝ ය.
(v) ඔවුහු ගුණදාස අමරසේකර සූරීන් සම්මානයකින් පුදති.

(ආ)

(i) සමහරුන් විසින් වගකිව යුතු තනතුරු සඳහා තම අනුගාමිකයෝ පත් කෙරෙති/ කරනු ලබති/ලැබෙති/ලබත්.
(ii) ළමයින් විසින් මේ දිනවල සරුංගල් සෑදෙයි/සෑදේ/සාදනු ලබයි/ලැබෙයි.
(iii) රජතුමා විසින් තොපි යුද පෙරමුණට යැවුණුහු/යවන ලදහු/ලද්දෙහු/යවනු ලැබූහු/ලැබුවෙහු/ලැබුණෙහු.
(iv) වංචනිකයන් විසින් කිහිප වතාවක් අපි මුළාවේ හෙළුණුමු/හෙළන ලදිමු/ලද්දෙමු/හෙළනු ලැබූමු/ලැබුවෙමු/ලැබුණෙමු.
(v) ඔවුන් විසින් ගුණදාස අමරසේකර සූරීහු සම්මානයකින් පිදෙති/පුදනු ලබති/ලැබෙති/ලබත්/ලැබෙත්.

***(ලකුණු 01 x 05 = 05 යි.)***

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සමාජ (සේවකයෝ/සේවකයන්) රටට හිත වැඩ (කරන්නෝ/කරන්නන්) වෙති.
(ii) ගුරුවරයෙක් ද ගුරුවරියක් ද (මම ද/නුඹ ද) උත්සවයට සහභාගි (වෙමු/වෙති.)
(iii) විදේශීය (නැවියන්/නැවියෝ) වරායට සේන්දු වී (ඇත/ඇත්තේ ය.)
(iv) (මා/මම) අනාගතය නුවණින් (දකිමි'යි/දකිති'යි) උපදේශකයෝ සිතති.
(v) (දරුවකු/දරුවෙක්) මිස (වැඩිහිටියෙක්/වැඩිහිටියකු) මේ ක්‍රියාව නො කරයි.

(ලකුණු 05 × 3 =15 යි.)

(ඉ)

| | | |
|---|---|---|
| (i) | සේවකයෝ | කරන්නෝ |
| (ii) | මම ද | වෙමු |
| (iii) | නැවියන් | ඇත |
| (iv) | මා | දකිති'යි |
| (v) | දරුවකු | වැඩිහිටියෙක් |

***(ලකුණු 01 x 05 = 05 යි.)***

***(මුළු ලකුණු 05 x 3 = 15 යි.)***



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **අටලෝදහම** හමුවෙහි කම්පිත **නොවන්නෝ** තාදි **ගුණැත්තෝ** ය.
(**අටලෝදහම** - සමාස, **නොවන්නෝ** - විභක්ති, **ගුණැත්තෝ** - සන්ධි)

(ii) **තනබරණින් සැරසුණු රූමත්** අංගනාවෝ වීථියෙහි තිබඳ ව සැරිසැරූහ.
(**තනබරණින්** - සන්ධි, **සැරසුණු** - කෘදන්ත, **රූමත්** - තද්ධිත)

(iii) කපුවන් **දෙවියන් යදිද්දී** බැතිමත්තු දොහොත් මුදුන් **දී** වඳිති.
(**දෙවියන්** - විභක්ති, **යදිද්දී** - අසම්භාව්‍ය ක්‍රියා, **දී** - ක්‍රියා)

(iv) **ප්‍රේමියේ**, සෙනෙහෙ සඳරැස් **වැද හදකුමුද** පුබුදු වේවා!
(**ප්‍රේමියේ** - විභක්ති, **වැද** - ක්‍රියා, **හදකුමුද** - සමාස)

(v) **නිමල** පුලිනතල මත සසල ව **හැපෙන** දළරළ පෙළ **සවනත** පිණවයි.
(**නිමල** - උපසර්ග, **හැපෙන** - කෘදන්ත, **සවනත** - තද්ධිත) (ලකුණු 03 × 5 =15 යි.)

| | වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|---|
| (i) | අටලෝදහම | සමාස | විශේෂණ සමාසය/සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය |
| | නොවන්නෝ | විභක්ති | ප්‍රථමා විභක්තිය/පෙර විබත |
| | ගුණැත්තෝ | සන්ධි | පූර්ව ස්වර ලෝප සන්ධිය/පෙර සර ලොප් සඳ |
| (ii) | තනබරණින් | සන්ධි | ස්වර සන්ධිය/සර සඳ/ආරෝහණ සන්ධිය |
| | සැරසුණු | කෘදන්ත | අතීත කාල කෘදන්ත |
| | රූමත් | තද්ධිත | අස්ත්‍යර්ථය/ඇත යන අර්ථය |
| (iii) | දෙවියන් | විභක්ති | කර්ම විභක්තිය/කම් විබත/ද්විතීයා විභක්තිය |
| | යදිද්දී | අසම්භාව්‍ය ක්‍රියා | කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා |
| | දී | ක්‍රියා | පූර්ව ක්‍රියා/පෙර කිරිය |
| (iv) | ප්‍රේමියේ | විභක්ති | ආලපන විභක්තිය/අලප් විබත |
| | වැද | ක්‍රියා | පූර්ව ක්‍රියා/පෙර කිරිය |
| | හදකුමුද | සමාස | විශේෂණ සමාසය/වෙසෙසුන් සමස්/උපමාන අපර/උත්තර පද විශේෂණ සමාසය |
| (v) | නිමල | උපසර්ග | නිශේධාර්ථ/රහිතාර්ථ/විරෝධාර්ථ |
| | හැපෙන | කෘදන්ත | වර්තමාන කාල කෘදන්ත/ වර්තමාන කාල කර්මකාරක කෘදන්ත |
| | සවනත | තද්ධිත | ස්වාර්ථය (එය ම යන අර්ථය) |

***(ලකුණු 03 x 05 = 15 යි.)***

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) …………………. හෙටක් වෙනුවෙන් අපි දිවා රෑ නො නිදා බලා සිටිමු.

(ii) ඒ වෙස් ……………………. උලෙළ වනාහි සැම දෙනාගේ ම කැපවීමේ අග්‍රඵලයකි.

(iii) සන්ධ්‍යා යාමයේ තැන් තැන්වල වූ ……………………. සෙවණැලි පාළු මූසල බවක් ඉසිලී ය.

(iv) නිරෝගී ශරීරයක් මෙන් ම ……………………. මනසක් ද පුද්ගලයකුට තිබිය යුතු ය.

(v) ඒ ……………………. රාත්‍රිය භයානක ශබ්දයන්ගෙන් පිරී පැවතුණේ ය.

(vi) සියලු නළුනිළියෝ ඒ මහා ……………………. ප්‍රසංගයට සහභාගි වූහ.
(සුපසන්, අන්ධකාර, නර්තන, ප්‍රසන්න, අඳුරු, නැටුම්)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(අ)
(i) සුපසන්
(ii) නැටුම්
(iii) අඳුරු
(iv) ප්‍රසන්න
(v) අන්ධකාර
(vi) නර්තන

***(vii) (ලකුණු $\frac{1}{2}$ x 06 = 03 යි.)***

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

'කොරන්නතෝනයි කිව්වට ඔව්ව් කොරන්න ඇහැක් වැඩයැ' (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) කිරීමට අවශ්‍ය යැයි කීව ද ඒවා කළ හැකි වැඩ ද?/කිරීමට අවශ්‍ය බව කීවත් ඒවා කළ හැකි දේවල් ද?/දේ ද?

(ලකුණු $\frac{1}{2} \times 06 = 03$ යි.)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) තොටියා **හබලෙන් ඔරුව** පැද්දේ ය.

(ii) යාචකයා **ගමින්** ගමට ගොස් **මුදල්** එකතු කළේ ය.

(iii) **මාගේ** ව්‍යාකරණ පොත **රාක්කයෙහි** ඇත. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ)

(i) හබලෙන් - කරණ විභක්තිය/විබත — ඔරුව-කර්ම විභක්තිය /කම් විබත (ද්විතීයා විභක්ති)

(ii) ගමින්-අවධි විභක්තිය/අවදි විබත/(පඤ්චමී විභක්තිය) — මුදල්-කර්ම විභක්තිය/කම් විබත (ද්විතීයා විභක්තිය)

(iii) මාගේ-සම්බන්ධ විභක්තිය/සබඳ විබත (ෂෂ්ටී විභක්තිය) — රාක්කයෙහි-ආධාර විභක්තිය/අදර විබත (සප්තමී විභක්තිය)

(ලකුණු $\frac{1}{2} \times 06 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

"වර පුරුෂය තෝ කොහි සිට මෙහි පැමිණියෙහි ද මාරයාගේ කටට වැද ඉත් බේරී පලා යාමට තරම් තා පින්කර නැත. "අනේ මාහට සමාව දෙනු මැනවයි වර පුරුෂයා බැගෑපත් ව ඉල්ලා සිටියේ ය.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) "වර පුරුෂය, තෝ කොහි සිට මෙහි පැමිණියෙහි ද? මාරයාගේ කටට වැද, ඉත් බේරී පලා යාමට තරම් තා පින්කර නැත. "අනේ! මාහට සමාව දෙනු මැනව" යි වර පුරුෂයා බැගෑපත් ව ඉල්ලා සිටියේ ය.

(ලකුණු $\frac{1}{2} \times 06 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම හොඳින් ඉගෙන වෛද්‍යවරයෙක් වෙමි"යි ළමයා පැවසී ය.

(ii) "ක්‍රීඩකයෝ ඊයේ තරගයෙන් ජය ලැබූහ"යි ක්‍රීඩා නිලධාරියා කී ය.

(iii) "අපි අපේ පොත් ශිෂ්‍යයන්ට දෙමු"යි ලේඛකයෝ ප්‍රකාශ කළහ.

(ලකුණු $01 \times 3 = 03$ යි.)

(උ)

(i) තමා හොඳින් ඉගෙන වෛද්‍යවරයකු වන බව ළමයා පැවසී ය.

(ii) ක්‍රීඩකයන් පෙර දින තරගයෙන් ජය ලැබූ බව ක්‍රීඩා නිලධාරියා කී ය./(පැවසුවේ ය).

(iii) තමන් තමන්ගේ පොත් ශිෂ්‍යයන්ට දෙන බව ලේඛකයෝ ප්‍රකාශ කළහ.

(ලකුණු $01 \times 03 = 03$ යි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එදින නන්ද කුමාරයන්ට ජීවිතයේ **අතිශය** වැදගත් දිනයක් ම වූයේ ය. ඒ ඔහුගේ විවාහෝත්සවය, ගෘහප්‍රවේශෝත්සවය සහ **අභිෂේකෝත්සවය** යන ත්‍රිමංගල්‍යය ම යෙදී තිබුණු බැවිනි. බුදුපියාණෝ එදින මාලිගයට වැඩම කොට දානය වළඳා අන්තයෙහි තම පාත්‍රය නන්දගේ අතට දී එය ද රැගෙන පසුපසින් එන ලෙස පැවසූහ. නන්ද කුමාරයෝ බුද්ධ ගෞරවයෙන් පාත්‍රය ද ගෙන උන්වහන්සේ සමග ම විහාරයට ගියහ.

නන්දයන්ගේ **අනාගත** ප්‍රියාම්බිකාව වීමට සිටියේ ජනපද කල්‍යාණිය යි. ඒ **අභිරූපිකාවෝ** දුටු දුටුවන් මනනුවන් පැහැර ගන්නා රූපශෝභාවෙන් සමලංකෘතයෝ ය; නා ළපල්ලට සරදම් කරන සුලු වූ අධර යුග්මයෙන් **අලංකෘතයෝ** ය; සුපුල් පියුම පරදවන සුරත් මුවමඬලින් **අභිරමණියෝ** ය; වට, මට පැටි හසුන් නමැති තනහසුන්ගෙන් සාලංකෘතයෝ ය, බැලූවන් නෙතුයුග ඇද බැඳ ගන්නා සිහිනිඟින් හා පුළුලුකුලින් මනහරයෝ ය; සැබවින් ම මිහිබට දෙවඟනක හා සදිසියෝ ය.

බුදුන් පසුපස ගිය ද නන්දගේ සිත්හි වූයේ සිය ප්‍රියාව පිළිබඳ මතකය යි. "නන්දයෙනි, ඔබ මහණ වීමට කැමති ද?" යි බුදුන් වහන්සේ විමසූ සේක. නන්දයෝ අපරිමිත ගෞරවයෙන් "එසේ ය ස්වාමීනි" යි කීහ. මහණ වුව ද ඔහුගේ සිත්හි පැතිර සිටියේ භාවනාව සම්බන්ධ කර්මස්ථාන නො ව ජනපද කල්‍යාණිය සම්බන්ධ **අතීත** ස්මරණයන් ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පටිපාටියෙන් ලියන්න.
(ii) මෙහි ඇති ස්වර සන්ධි පද **තුනක්** උපුටා දක්වන්න.
(iii) පැවසූහ, කැමති, ගෞරවයෙන් යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.
(iv) ඡේදයේ ඇතුළත් ප්‍රථම පුරුෂ, අතීතකාල, බහුවචන ආඛ්‍යාත පද **තුනක්** උපුටා දක්වන්න.
(v) මෙහි ඇති ඝෝෂ මහාප්‍රාණයක් හා මූර්ධජ ව්‍යඤ්ජන **දෙකක්** සහිත පදයක් ලියන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

(i) අතිශය, අතීත, අනාගත, අභිරමණියෝ, අභිරූපිකාවෝ, අභිෂේකෝත්සවය, අලංකෘතයෝ
(ii) සිහිනිඟින්, පුළුලුකුලින්, දෙවඟනක
(iii) පැවසූහ - කෙටි ඇදපිල්ල, දීර්ඝ පාපිල්ල /දික් කොන් පාපිල්ල
කැමති - කෙටි ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල
ගෞරවයෙන් -කොම්බුව හා ගයනුකිත්ත, කොම්බුව
(iv) පැවසූහ, ගියහ, කීහ.
(v) අභිරමණියෝ

*(ලකුණු 03 x 05 = 15 යි.)*

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මහාප්‍රාණාක්ෂර
(ii) ගෞරවාර්ථයේ 'ආණ, අණු, අණි' ප්‍රත්‍යය
(iii) අවධි විභක්ති සමාසය
(iv) ඛේදාර්ථයේ නිපාත
(v) වර්තමාන කාල, මධ්‍යම පුරුෂ ක්‍රියාරූප

(ලකුණු 05 × 3 =15 යි.)

(i) මහාප්‍රාණාක්ෂර

ශබ්දෝච්චාරණයේ දී මහා ශ්වාසයෙන්/ප්‍රාණයෙන් යුක්ත ව උපදවන ශබ්ද මහාප්‍රාණ අක්ෂර නම් වේ.

අඝෝෂ හා ඝෝෂ වශයෙන් ද විවිධ උත්පත්ති ස්ථාන පදනම් කර ගෙන ද මහාප්‍රාණාක්ෂර ශබ්ද වෙයි.

අඝෝෂ මහාප්‍රාණාක්ෂර - ඛ, ඡ, ඨ, ථ, ඵ

ඝෝෂ මහාප්‍රාණාක්ෂර - ඝ, ඣ, ඪ, ධ, භ

(ii) ගෞරවාර්ථයේ ආණ, අණු, අණි

ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය ලෙස හඳුන්වන මේවා ගෞරවාර්ථය ඇති කිරීමට භාවිත වෙයි. පුරුෂ ලිංග පද සමග 'ආණ, අණු' භාවිත කෙරේ.

සිටු + ආණ - සිටාණ

පිය + ආණ - පියාණ

පුත් + අණු - පුතණු

ස්ත්‍රී ලිංග පද සමග 'අණි' භාවිත කෙරේ.

මා + අණි - මෑණි

නග + අණි - නැඟණි

(iii) අවධි විභක්ති සමාසය

අවධි විභක්තියට අයත් පදයක් පෙර පදය ලෙසත් වෙනත් පදයක් පසු පදය ලෙසත් යෙදී සිදු වන සමාසය 'අවධි විභක්ති සමාසය' නම් වේ.

උදා : සොරබිය - සොරුන්ගෙන් වන බිය

සතුරුඋවදුරු - සතුරන්ගෙන් වන උවදුරු

අහස්දිය - අහසින් වැටෙන දිය

(iv) ඛේදාර්ථයේ නිපාත

සිතට නැගෙන දුඃඛ, වේදනා, ශෝක වැනි භාවයන් ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරන නිපාත ඛේදාර්ථයේ නිපාත ලෙස හැඳින්වේ.

උදා : අනේ, අහෝ, අය්යෝ, අපොයි, අදෝ.

(v) වර්තමාන කාල, මධ්‍යම පුරුෂ ක්‍රියාරූප

වර්තමාන කාල මධ්‍යම පුරුෂ ක්‍රියා රූප ඒක වචන, බහු වචන වශයෙන් කොටස් දෙකකි.

තෝ, තී, නුඹ, යුෂ්මතා, තොපි, නුඹලා යුෂ්මත්හු වැනි මධ්‍යම පුරුෂ ඒක - බහු වචන නාම පද සමඟ යෙදෙන ක්‍රියාරූප මධ්‍යම පුරුෂ ක්‍රියාරූප ලෙස හැඳින්වේ.

තෝ පාඩම් කරහි.

නුඹ වැඩ කරහි.

නුඹලා පාඩම් කරහු.

තොපි වැඩ කරහු.

- සිංහලයෙහි විධි ක්‍රියා වර නැඟීම ද මධ්‍යම පුරුෂයෙහි වෙයි.
  බල, බලව, බලනු, බලවු වැනි පද ද මධ්‍යම පුරුෂ ක්‍රියා සේ ගැනේ.

**(05 බැගින් මුළු ලකුණු 5 x 3 = ලකුණු 15 යි.)**

***



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න